# දඹදෙණි යුගයේ පිරිවෙන් අධ්‍යාපනය

**විමල් ජී. බලගල්ලේ මහතා**

1.1 දූරාතීතයෙහි සිට ලක්දිව විහාරාරාම මගින් දී ගෙන ආ අධ්‍යාපනය 'පිරිවෙන්' අධ්‍යාපනය වශයෙන් **හැඳින්වෙන්ට** පටන් ගත් කාලපරිච්ඡේදය එතරම් පැහැදිලි නොවේ. එහෙත් දඹදෙණි යුගයේ දී ශාස්ත්‍රාගමධර ව්‍යක්ත භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් පැවති බෞද්ධ අධ්‍යාපන ආයතන 'පිරිවෙන්' නමිනුදු හැඳින්වුණු බවට නම් නිශ්චිත සාධක ඇත. කෙසේ වුවත් බෞද්ධ විහාරීය අධ්‍යාපන ආයතන හැඳින්වෙන නාමාන්තරයක් වශයෙන් එය වහරට පත්වූයේ එම යුගයට සියවස් දෙක තුනකට ඉහත දී,– යටත් පිරිසෙයින් පොළොන්නරු යුගයේ දී,– විය හැකි බව අනුමාන කළ හැකිය.

1.2.1 ලක්දිව 'පිරිවෙන්' ඉතිහාසය ඇරඹෙන්නේ දෙවන පෑතිස් රජු (ක්‍රි.පූ. 250–210) දින මිහිඳු මාහිමියන් ප්‍රමුඛ ධර්මදූත භික්ෂූන් වහන්සේලා විසින් මෙහි බුදු සසුන පිහිටුවීමත් සමග සමකාලීනව ය. දෙවන පෑතිස් රජු දවස තිස්සාරාම මහාවිහාරානුබද්ධව පිහිටු වූ කාලපාසාද, සුනහාත, දීඝචංකමණ ආදි පිරිවෙන් ඇතුළුව අනුරාධපුර යුගයේ අවසානය තෙක් පිහිටුවන ලද පිරිවෙන් විශාල සංඛ්‍යාවක් පිළිබඳව වංශ කථා, ශිලා ලේඛන ඇතුළු ඓතිහාසික වාර්තාවල සඳහන් වන නමුදු, ඒවා මුඛ්‍ය වශයෙන් භික්ෂූන් සඳහා කරවූ වාසගෘහ විශේෂයක් විය. එකම විහාරස්ථානයක කරවන ලද පිරිවෙන් කීපයක් නැතහොත් පිරිවෙන් පංතියක් ගැන වංශ කථාවල එන පුවත්වලින් මෙය තව දුරටත් තහවුරු වේ.[1] මේ කාලයේ දී ඇතැම් විටෙක පිරිවෙනක් ඉගැන්වීම් කටයුතු සඳහා යොද ගැනුණි නම් ඒ අමුඛ්‍ය වශයෙනි. මුල් අවදියේ දී අධ්‍යාපන ආයතනයක් වශයෙන් සැලකුණේ 'විහාරය' ම යි. බෞද්ධ විහාරාරාමයන් ඇරඹී නොබෝ කලකින් ම ඒවා බොහොමයක් බෞද්ධ අධ්‍යාපන ආයතන වශයෙන් ද ක්‍රියාත්මක වන්නට වූ බව පෙනේ. බහුශ්‍රැත භික්ෂු නමක් විසූ ඇත ප්‍රත්‍යන්තයෙක පවා වූ විහාරය නිරායාශයෙන් අධ්‍යාපන ආයතනයක් බවට පත්විය. රාජාමාත්‍යාදි ප්‍රභූන්ගේ අනුග්‍රහයෙන් සිව්පසය නොමඳව සැපයුණු නගරාශ්‍රිත 'මහාවිහාර' අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත්වූ අතර, ඉන් සමහරක් දේශාන්තරයෙහි විහිදි කීර්තියක් ඇති, දහස් ගණන් දේශීය විදේශීය ශිෂ්‍යයන් ඉගෙනීම ලැබූ විශ්ව විද්‍යාලය ස්වරූපයේ ආයතන වූ බව ඓතිහාසික සටහන් මගින් හා ෆාහියන් ආදි දේශාටකයන්ගේ විස්තරවලින් අනුමිත වේ. අනුරාධපුර යුගයේ අවසාන භාගය වන තුරුම තිස්සාරාම මහාවිහාරයත් අභයගිරි මහාවිහාරයත් එබඳු උසස් අධ්‍යාපන ආයතන වශයෙන් පැවතිණ. කලක් ඉන්දියාවේ පැවති නාලන්ද, වික්‍රමශිලා ආදි විශ්ව විද්‍යාලය ස්වරූපයේ බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන ද හැඳින්වී ඇත්තේ 'මහාවිහාර' නාමයෙන් ම බව මෙහි දී සිහිපත් කළ යුතුය.

1.2.2 අනුරාධපුර යුගයේ ද්විතීය භාගයේ දී මූළ, අයතැන්, මූළායතන, මූළ, සමූහ යන නම්වලින් ද ලක්දිව පළමු පෙළේ ශාසනික – අධ්‍යාපනික ආයතන කීපයක්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

හැඳින්වුණු බව වංශකථාදියෙන් හා සෙල්ලිපි මගින් හෙළි වේ. එම යුගයේ අග හරිය වන විට මේවා ගණනින් අට වන තෙක් වැඩිණ. මෙයින් උතුරුමුළ, මහ **නෙත්පා** මුළ, කපාරා මුළ, වහදු මුළ යන හතර අභයගිරි මහාවිහාරානුබද්ධව පැවති අතර දකුණු ගිරි වෙහෙර වූ දක්ඛිණ මූලය ද අභයගිරි නිකායානුයායී ආයතනයක් වූ බව පෙනේ. ගලතුරු මුළ, විල්ගම් මුළ යන දෙක මහාවිහාර නිකායානුයායී ආයතන විය. සෙනෙවිරද් මුළ මහාවිහාරානුබද්ධ ආයතනයක් වූව ද කලෙක ජේතවන විහාරය හා සබඳතා පැවැත්වූ බව පෙනේ. පොළොන්නරු යුගයේ දී ද මූලායතන සංඛ්‍යාව අටක්ව පැවතිණ. මාඝාදීන්ගේ යුද්ධාක්‍රමණ හේතු කොට ගෙන මේවායේ අඛණ්ඩ පැවැත්මට බාධා පැමිණිය ද දඹදෙණි යුගයෙහි දු මූලායතන සක්‍රියව පැවති බව දඹදෙණි කතිකාවතින් හා ඓතිහාසික ලේඛනවලින් හෙළිවේ.

1.3 අනුරාධපුර යුගයෙහි පටන් ම ග්‍රාමවාසී, වනවාසී (ආරණ්‍යක) යන භික්ෂු සමූහ දෙක ද 'මූල' නාමයෙන් හැඳින්වුණු බව ශාසන ඉතිහාසයෙන් පෙනේ. මහා විහාර පාර්ශ්වයට ද අභයගිරි පාර්ශ්වයට ද අයත් අරණ්‍ය සේනාසන විය. අධ්‍යාපන ආයතන පැවැත්වීම සාමාන්‍යයෙන් ග්‍රාමවාසය සතු කාර්යභාරයක් සේ සැලකුණ ද අධ්‍යාපනය දීම ග්‍රාමවාසීන්ගේ ඒකාධිකාරයක් නො වීය. දිඹුලාගල කාශ්‍යප ආදි මාහිමිවරුන්ගෙන් උගත් ශාරිපුත්‍ර සංඝරාජ ආදි ගත්කරු පඬිපරපුර දෙස බැලීමේදී පෙනෙන්නේ පොළොන්නරු දඹදෙණි යුගවල දී දිඹුලාගල ආරණ්‍යායතනය ද ප්‍රමුඛ අධ්‍යාපන මධ්‍යස්ථානයක් වූ බවයි. පළාබත්ගල දඹදෙණි යුගයෙහි ඇති වූ එබඳු තවත් ආරණ්‍යායතනයකි.

1.4 දඹදෙණි යුගයේ පිරිවෙන් අධ්‍යාපනය ගැන සාකච්ඡා කිරීමේ දී මෙකී මූල-ආයතන ගැන මෙන් ම 'පිරිවෙන්' නමින් හැඳින්වුණු බවට මෙතෙක් සාධක ලැබී නැතත්, ප්‍රසිද්ධ අධ්‍යාපන ආයතන වශයෙන් ක්‍රියාත්මක වූ බවට නිශ්චිත සාධක ඇති දඹදෙණියේ විජයසුන්දරාරාමය වැනි 'විහාර' කෙරෙහි ද අපේ සැලකිල්ල යොමු විය යුතු ය.

2.1 ඉහත දැක්වූ කරුණු අනුව, දඹදෙණි යුගයේ අධ්‍යාපන කාර්යභාරය ඉසිලූ ආයතන දෙකොටසක් විය. එම යුගය තුළ රාජාමාත්‍යාදි ප්‍රභූන් විසින් අලුතුවෙන් ගොඩනංවන ලද පිරිවෙන් විහාර හා ඉහත යුගයෙක සිට අඛණ්ඩව හෝ පුනරුත්ථාපිතව හෝ පවත්වා ගෙන ගිය පිරිවෙන් විහාර යනුවෙනි. මූලායතන ද මේ දෙවනු කී කොටසට වැටේ.

2.2.0 තවත් ක්‍රමයකින් — එනම්, දඹදෙණි කතිකාවතෙහි එන පාඨයකට දිය හැකි අර්ථකථනයක අනුසාරයෙන්,— මේ යුගයේ පිරිවෙන් වර්ග හතරකට හෝ පහකට හෝ බෙදිය හැකිය ". . . ශික්ෂිත තෙර තනතුරු පත් කෙනකුන් නායක තෙන අදහසින් සංඝසම්මුති රාජසම්මුතීන් අයතැනට පැමිණවිය යුතු. මෙතරම් මැ කෙනෙක් නිශ්‍රය මුක්ත වුවද මුළ කැමති වුව ද අයතැන් වැළතට හා **මා තෙරුන් මුළ නැඳි පිරිවෙන් ආදි වූ බලවත් පිරිවෙනට**ද සංඝසම්මුති රාජසම්මුතීන් තැකිය යුතු. සෙසු **නොයෙක් දරුගම් වටනාපස ඇති පිරිවෙනට** සුදුසු ගුණ නුවණ ඇති බඩතුරු ආභිසමාචාරිකයෙහි යොද හික්ම විය හෙන තෙර නිස මුක්ත තෙනක්ම නායක තැන් දක්වාලිය යුතු"[3] යනු මෙහිලා අදාළ පාඨය යි. මෙයට අනුව (1) මා තෙරුන් පිරිවෙන් (2) මුළ පිරිවෙන්. (3) නැඳි පිරිවෙන්. (4) සෙසු ස්වයංපෝෂිත පිරිවෙන් හා

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

(5) සාමාන්‍ය පිරිවෙන් යනුවෙන් දඹදෙණි යුගයෙහි වූ විහාරීය අධ්‍යාපන ආයතන සමස්තය වර්ග කළ හැකි බව පෙනේ.

2.2.1 මෙහි 'මහතෙරුන් පිරිවෙන්' නම් ග්‍රාමවාස වනවාස දෙක්හි නායකත්වයට පත් මහතෙර දෙනමගේ ප්‍රධානත්වයෙන් පැවති අධ්‍යාපන මධ්‍යස්ථාන දෙක යි. පොළොන්නරු යුගයේ පැවති ජේතවන මහාවිහාරයත් දිඹුලාගල ආරණ්‍ය සේනාසනයත් මෙනි. දඹදෙණි යුගය ආරම්භයේ දී දිඹුලාගල තව දුරටත් වනවාස මූලස්ථානය සේ සැලකුණ ද පසුව එය පළාබත්ගලට මාරු වූ බව පෙනේ. දඹදෙණියේ විජය සුන්දරාරාමය ග්‍රාමවාස මූලස්ථානය විය.

2.2.2 'මූල පිරිවෙන්' නම් ඉහත කී මූලායතන අටට අයත් වූ මධ්‍යස්ථාන අට යි.[4]

2.2.3 'නැඳි පිරිවෙන්' නම් නද්ධ පරිවේණ හෙවත් මහතෙරුන් පිරිවෙන්වලට හෝ මූල පිරිවෙන්වලට හෝ අනුබද්ධ වූ පිරිවෙන් ය.

මෙකී පිරිවෙන් වර්ග තුන ම කතිකාවතෙහි 'බලවත් පිරිවෙන්' සේ සලකා ඇත. ඒවා කෙතරම් බලවත් හා වැදගත් සේ සලකා ඇද්ද යන්න ඒවායේ අධිපති වරුන් **පත්කිරීම සඳහා පනවා ඇති ව්‍යවස්ථාවලින් පැහැදිලි වේ.** මෙකියන පිරිවෙන් පති පදවි ලැබිය හැක්කේ නිර්දිෂ්ට අනෙකුත් සුදුසුකම් ඇති තෙර නනතුරු පත් අයකුට පමණි. ඒ සමග ම සංඝ සම්මුති රාජ සම්මුති දෙකත් අවශ්‍ය වේ. 'තෙර නනතුරු' ලැබීම සඳහා ශීලසංවරාදි ගුණයන්ට අමතර වැඩිගත්කම ද තිබිය යුතු වූ අතර අවම වශයෙන් අපේක්ෂිත වූ ධර්ම විනය ඥානය කෙතරම් ද යන්න කතිකාවතෙහි ම නිර්දිෂ්ටව ඇත.[5]

2.2.4 මෙහි 'ස්වයංපෝෂිත' යනුවෙන් අර්ථකථනය කළ සෙසු පිරිවෙන් නම් පිරිවෙන පිහිටි මව්ගමට අමතරව භික්ෂු ශිෂ්‍යයන් බොහෝ දෙනෙකුට ප්‍රත්‍යය පහසුව සැලසිය හැකි තරමට 'දරුගම්' හා 'වටනාපස' ඇති ඉහත කී තුන් වගෙන් අන්‍යතර වූ පිරිවෙන් ය.

2.2.5 'සාමාන්‍ය පිරිවෙන්' යන්නෙන් අභිප්‍රේත වූයේ ඉහත කී සිව්වගෙන් ම පරිබාහිර වූ ව්‍යක්ත ශාස්ත්‍රාගමධර භික්ෂූන් යථාවකාශ පරිදි සිසුන්ට ඉගැන්වීම කළ විහාරස්ථාන ය.

2.3 පිරිවෙන්වල ඉගැන්වීම කරන ලද්දේ එක් එක් ශිෂ්‍යයාට වෙන වෙන ම නැත හොත් පුද්ගල අවධානය යෙදිය හැකි තරමට කුඩා වූ ශිෂ්‍ය ශ්‍රේණි වශයෙන් ගැනීමෙනි. කවර විෂයක් සම්බන්ධයෙන් වුව ද වැඩි වශයෙන් පාඨ්‍ය ග්‍රන්ථ මූලිකව ඉගැන්වීම කෙරුණු අතර, පාඨ්‍ය ග්‍රන්ථ ඉගැන්වීමේ දී **සුදුසු** තන්හි සම්ප්‍රදායාගත නයින් දැක්වූ සම්බන්ධ, පද විභාග, පදාර්ථ, නෛරුක්තික පද විග්‍රහ, චෝදනා,පරිහාර යන ෂඩාකාරය මගින් දැනුම තහවුරු කරන ලදී.

3.0 සාමාන්‍යයෙන් දඹදෙණි යුගය ඇරඹෙන්නේ ලක්දිව සිය ගණන් වෙහෙර විහාර නසා පොත්පත් ද දහස් ගණනින් ගිනිබත් කිරීමෙන් රටේ අධ්‍යාපනයට මහත් හානියක් කළ බව කියන ආක්‍රමණිකයකු වූ කාලිංග මාඝ රජු යුදෙහි පරදවා පොළොන්නරුවෙන් පලවා හැර දඹදෙණිය සිය රාජධානිය කොට ගත් විජයබාහු iii (1232–36)

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

රජුගෙනි. එහෙත්, දඹදෙණි යුගයේ අවසානය එතරම් නිශ්චිත නොවේ. විජයබාහු iii රජුට අනතුරුව දඹදෙණියේ රජය කළ පරාක්‍රමබාහු ii (1236–70), විජය බාහු iv (1270– 72) යන රජුන්ගෙන් පසු සිහසුනට පත් භුවනෙකබාහු 1 (1272– 84) රජු වසර කීපයක් දඹදෙණියෙහි වැස, යාපහුව ද රාජධානියක් කොට ගෙන එහි විසූ හෙයිනි. එසේ වුව ද, ඔහු දඹදෙණියෙන් ඇරඹුණු ශාසනික සංස්කෘතික කටයුතු නොකඩවා කර ගෙන ගිය බව පෙනේ. එපමණක් නොව, කුරුණෑගල රාජධානිය බවට පත්වීමෙන් පසුව ද පරාක්‍රමබාහු iv (1302—26) රජු නෙක් විසූ රජුන් සියලු දෙන දඹදෙණි පරපුරේ ම අය වූ බැවින් ඔවුන් දඹදෙණියෙන් ඇති වූ ශාසනික ආධ්‍යාපනික පුනරුදය රැකගැන්මටත් ඉදිරියට ගෙන යැමටත් ප්‍රයත්න දැරූ බවට සාධක ඇත.

3.1.1 දඹදෙණි යුගයෙහි අභිනවයෙන් ගොඩනංවන ලද ප්‍රථම ආධ්‍යාපනික මධ්‍යස්ථානය වශයෙන් සැලකිය හැක්කේ දඹදෙණියේ විජයසුන්දරාරාමය යි. මෙය විජය බාහු iii රජු විසින් කරවූවක් බවට ඓතිහාසික ලේඛන ඒකමතික වෙයි.[6] මෙය පිරිවෙන් නමිනුදු හැඳින්වුණු බවක් අප්‍රකට වුව ද තත්කාලයෙහි රටේ පිළිගැනීමට පාත්‍ර වූ ප්‍රධාන අධ්‍යාපන පියයක් වූ බවට නම් සැකයක් නැත. මෙහි උගන්නා භික්ෂු ශ්‍රාමණේරයන් උදෙසා සලස්වා තිබූ පහසුකම් ගැන මහාවංශයත් පූජාවලියත් උත් කර්ෂයෙන් වර්ණනා කරයි.[7] ආරම්භයේ දී මෙහි ආධිපත්‍යය දැරුවේ පොළොන් නරු සමයෙහි විසූ ග්‍රන්ථකාරක ශ්‍රේෂ්ඨ පඬිරුවනක් වශයෙන් ඉතිහාසගතව ඇති ශාරිපුත්‍ර සංඝරාජයන්ගේ ප්‍රධාන ශිෂ්‍ය වූ ද තදනන්තර ශාසනානුරක්ෂක ධුරය දැරූවා වූ ද ශාස්ත්‍රාගමධර මහපඬිවරයකු වූ සංඝරක්ෂිත මාහිමියෝ යි. උන්වහන්සේගෙන් උගත් සිසුන් අතර **ආරඤ්ඤක** මේධංකර, ආනන්ද වනරතන ආදි ගත්කරු පැවිදි පඬිවරු ද පැරකුම්බා කුමර (පසුව රජ), බුවනෙකබා කුමර ආදි ගිහි පඬිවරු ද වූහ. සංඝරක්ෂිත මාහිමියන් ධර්ම විනය හා ව්‍යාකරණය පිළිබඳ පොත් කීපයක් පාලියෙන ලියා ඇත. එසේ ම සුබෝධාලංකාර නම් කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ ප්‍රථම පාලි ග්‍රන්ථය ද වුත්තෝදය නම් ප්‍රථම පාලි ඡන්දෝග්‍රන්ථය ද ලිවීමේ ගෞරවය උන් වහන්සේට අයත් වෙයි. මෙයින් ඇතැම් පොත් ලියන්නට ඇත්තේ දඹදෙණියට පැමිණෙන් නට පෙරාතුව විය හැකි ය. සංඝරක්ෂිත මාහිමියන් ප්‍රමුඛ මහාසංඝයා විසින් 'වත්හිමි විජයබා' කතිකාවත සම්පාදිත වූයේත්, ආරණ්‍යක මේධංකර මාහිමියන් ප්‍රමුඛ මහා සංඝයා විසින් දඹදෙණි කතිකාවත සම්පාදිත වූයේත් මේ විජයසුන්දරාරාම මහා විහාරයේ දී ය. දඹදෙණියේ රජමාලිගයට නුදුරුව පිහිටි බවට සාධක සහිත මේ විහාරය එම නමින් එන වර්තමාන විහාර භූමිභාගය ද අන්තර්ගත වන පරිදි පිහිටා තිබුණු විශාල අධ්‍යාපන ආයතනයක් වන්නට ඇත.

3.1.2 විජයබාහු iii රජු වත්තල ද සිය නමින් විජයබාහු නම් රාජමහාවිහාරයක් කරවූ බව පූජාවලිය කියයි.[8] මහාවංශයෙන් ද එය තවදුරටත් තහවුරු වෙයි.[9] පැරකුම්බා ii රජුගේ පුතකු වූ තිලෝකමල්ල කුමරු වත්තල වාසස්ථාන කර ගැනීමෙන් පෙනෙන් නේ එකල එය මායා රටේ වැදගත් තැනක් වූ බව යි. කැළණි විහාරය හා දීර්ඝ කාලයක් සම්බන්ධතා පැවැත්වූ බව පෙනෙන වත්තල විජයබාහු මහාවිහාරය මුලින් ම පිළි ගන්වා ඇත්තේ වනවාසී නාගසේන මහතෙරුන්ට ය. ''වත්තල වෙහෙර වැඩ– වැඩහුන් වනවාසයෙහි, නාගසේන මහතෙරිඳුන්ට... ''[10] යනුවෙන් හංස සන්දේශ යෙහි සඳහන් වන්නේ මුන් වහන්සේ ගැන විය යුතු ය. නිකාය සංග්‍රහයෙහි ''ශාරිපුත්‍ර මහාස්වාමිපාදයන් පටන් ගෙන සංඝරක්ෂිතය, සුමංගලය, වාගීශ්වරය, ධර්මකීර්තිය,

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

නාගසේනය, ආනන්දය, වේදේහය, බුද්ධප්‍රියය, අනවමදර්ශිය යනාදි මහාස්ථවිර යෝ. . . '' යනුවෙන් දක්වෙන ග්‍රන්ථකාරක පඬිවරුන්ගේ නාමලේඛනයෙහි එන්නේ මේ නාගසේන හිමියන් ද යන්න සැක සහිත ය. ''මහානාගකුල සන්දෙස'' නම් පාලි කාව්‍යය ලියූ නාගසේන මහතෙර රුහුණේ **රම්භා** මහාවිහාරයෙහි විසූවෙකි. මේ කෘතිය පොළොන්නරු යුගයට අයත්සේ සැලකෙතත්[11] එහි කතුවරයා දඹදෙණි යුගය තෙක් ජීවත්වීම නොවිය හැක්කක් නොවේ.[12] එහෙත් දෙදෙනා එක් අයකු ලෙස සැලකීමට හෝ වත්තල විජයබාහු මහාවිහාරය අධ්‍යාපන ආයතනයක් වූ බව නිගමනය කිරීමට හෝ සාධක මෙතෙක් ලැබී නැත.

3.1.3 පැරකුම්බා ii රජු නෂ්ටප්‍රායව පැවති බොහෝ පොත්පත් දඹදිවිනුදු ගෙන්වා බොහෝ භික්ෂූන් ආගමයන්හි ද ව්‍යාකරණාදියෙහි ද විචක්ෂණ කරවීමට ප්‍රයත්න දැරූවකු බව මහාවංසය කියයි.[13] ඔහු විසින් ස්වකීය රාජ්‍ය සමයේ මුල් අවදියේ දී ම කරවූ **ආයතනයක්** නම් දෙවිනුවර 'නන්දන පිරිවෙන' යි. මෙය පිහිටියේ දේවමන්දිරානු බද්ධ භූමි මහාවිහාරස්ථානයේ විය හැකිය. රජු විසින් මෙය කරවන ලද්දේ ස්වකීය බෑනණුවන් වූ වීරබාහු ඇපාණන් ලවා ය.[14] දෙවුන්දර කිතග්බෝ ටැම් ලිපිය දසවන සියවසේ දී ගිරිහෙළ හෙවත් දෙවිනුවර වූ 'කිහිරැළි පිරිවනක්' ගැන සඳහන් කරයි.[15] එහෙත් එය හෝ නන්දන පිරිවෙන හෝ නිසැකව ම අධ්‍යාපන ආයතන වූ සේ සැලකීමට සාධක මඳ වේ. දඹදෙණි යුගයෙහි වුව ද 'පිරිවෙන්' නාමය විහාරීය අධ්‍යාපන ආයතනාර්ථයෙහිම යෙදුණු බවක් ඉඳුරා නොකිය හැකිය. කෙසේ වුවත් දෙවිනුවර විහාරස්ථානය දඹදෙණි යුගයේ දී අෂ්ටායතනයන්ගෙන් එකක් වූ ගලතුරු මූලට සම්බන්ධව පැවති බව 'අලුත්නුවර දේවාල ලිපියේ' එන ''පුරාතනෙහි මෙන් දෙවිනුවරත් ගලතුරු මූළ අයතැන් සාමීන්ගේ ම දවස හෙයින්''[16] යන කියමනෙන් පෙනේ. ගලතුරු මූල පොළොන්නරු යුගයෙහි රුහුණෙහි වූ ප්‍රමුඛ ශාසනික - ආධ්‍යාපනික ආයතනයක් විය. පැරකුම්බා 1 රජු දින පොළොන්නරුවෙහි කළ ශාසන ශුද්ධිය සඳහා ගලතුරු මූළ නන්දතෙරුන් ප්‍රමුඛ රුහුණු වැසි නිකායත්‍රය සංඝයා ද කැඳවන ලද බව මහාවංශය කියයි.[17] එහෙයින් දෙවිනුවර නන්දන පිරිවෙන ද ගලතුරු මූළට අනුබද්ධ **'නෑදි'** පිරිවෙනක් වූ සේ ගැනීමට බැරිකමක් නැත.

3.1.4 පැරකුම්බා ii රජු විසින් විශේෂයෙන් ප්‍රතිපත්ති ගරුක වූ භික්ෂූන් උදෙසා කරවන ලද පළාබත්ගල ආරණ්‍යවාසය ද[18] ශ්‍රේෂ්ඨ උගතුන් බිහි කළ විද්‍යා ස්ථානයක් විය. පාලි දඨාවංස කාව්‍යය ලියූ රාජගුරු ධර්මකීර්ති මහ තෙරුන්ගෙන් ඇරඹුණු බව පෙනෙන ධර්මකීර්ති ඇදුරු පරපුරේ මූලස්ථානය බවට පත්වූයේ මේ පළාබත්ගල වනවාසය යි.[19] මේ පරපුරේ ශාස්ත්‍රීය සේවාව පිළිබඳ විස්තරයක් සද්ධර්ම රත්නාකරයෙහි එයි.[20]

3.1.5 ස්වකීය ජාතභූමිය වූ ශ්‍රී වර්ධනපුරයෙහි පැරකුම්බා රජු විසින් කරවන ලද මහාවිහාරය හා පරාක්‍රමබාහු පිරිවෙන ද රජුගේ විශේෂ සැලකිල්ලට ලක් වූ ආයතනයක් වූ බව ඓතිහාසික වාර්තාවලින් පෙනේ.[21] දඹදෙණියෙන් අඩ යොදුනක් (හැ.6 ක්) තන්හි වූ බව කියන ශ්‍රී වර්ධනපුරය ඉතිහාසඥයන් විසින් මෙතෙක් හරිහැටි හඳුනා ගෙන නැත. පැරණි විහාරස්ථානයක් පිහිටි 'හිරිවඩුන්න' නම් ගම ග්‍රන්ථාගත විස්තරවලට ගැළපෙන බැවින් එය මේ ශ්‍රී වර්ධනපුරය විය හැකිය. පුරාවිද්‍යාත්මක අධ්‍යයනයකට භාජන විය යුතු තැනකි. දඹදෙණි අස්නෙහි විජයබා iii.පැරකුම්බා ii යන දෙරජුන්ගේ ම නමට මුලින් යොද ඇති 'නන්බඹර' යන්න ඔවුන්ගේ ජාතභූමිය සේ ගතහොත් ශ්‍රී වර්ධනපුර යනු ද එයට දෙන ලද නාමාන්තරයක් සේ ගත යුතු වෙයි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

3.1.6 පැරකුම්බා ii රජුගේ බාල සොහොවුරු වූ බුවනෙකබා මාපාණන් සියනමින් කරවූ 'බුවනෙකබා පිරිවෙන' සහිත බෙලිගල මහාවිහාරය[22] දළදාවට රැකවරණ සැලසීම නිසා ප්‍රසිද්ධියට පත්ව ඇත. එහෙත් එය අධ්‍යාපන ආයතනයක් වශයෙන් එතරම් ප්‍රසිද්ධියට පත්වූ බවක් නොපෙනේ..

3.1.7 කුරුණෑගල රජමහවෙහෙර 'මහේන්ද්‍රබාහු පිරිවෙන' පැරකුම්බා ii රජු විසින් කුරුණෑගල් නුවර විසූ සිය සොහොයුරු බුවනෙකබා යුවරජු ලවා කරවන ලද්දක් බව මහාවංශයත්, පූජාවලියත් පවසයි.[23] තවද රජු පුත් විජයබා කුමරු සිය සුලුපියාණන්ගේ අකාලාභාවයෙන් පසු යුවරජ පදවියට පත්ව කුරුණෑගලට ගොස් එහි වූ මහාවිහාරය දියුණු කොට බුවනෙකබා පිළිරුවක් තනවා අලුත කරවූ පිළිමගෙයි ම තබා දරුගම් වටනාපස පුද එයට 'බුවනෙකබා පිරිවෙන' යැයි නම් දුන් බව ද සඳහන් වේ.[24] මෙ කියන පිරිවෙන අධ්‍යාපන ආයතනයක් වීද යන්න අවිනිශ්චිත ය. කෙසේ වුව ද මෙහි දී 'මහේන්ද්‍රබාහු'හා 'බුවනෙකබාහු' යනු පර්යාය නාම හෝ විකල්ප නාම සේ ගැනීමට සිදු වෙයි. බුවනෙකබා යුවරජු එම පිරිවෙනට මහේන්ද්‍රබාහු යන නාමය තැබුවේ සිය නමින් ම බව කියන හෙයිනි. එසේ නැතහොත් 'මහේන්ද්‍ර' යන්න ඔහුගේ පූර්ව නාමයක් සේ ගත යුතු වෙයි. පරාක්‍රමබාහු iv රජු විසින් කරවා ප්‍රාඥමේධංකර තෙරුන්ට පිදූ බව කියන කුරුණෑගල පරාක්‍රමබාහු පිරිවෙන[25] වෙනම ආයතනයකි.

3.1.8 දඹදෙණි යුගයේ පිරිවෙන් අතරෙහි ඉතා ප්‍රකට අධ්‍යාපන ආයතනයක් නම් ප්‍රතිරාජ පිරිවෙන යි. අවිනෂ්ට හෙළ වියරණ ගත් අතුරෙන් පැරණිතමය වූ 'සිදත් සඟරාවේ' කතුවරයා පතිරජ පිරුවන්පතිවරයකු බව එහි සමස් අදියර අග එන ''දෙනෙ දැනැ (**මෙසිදත පතිරජ පිරුවන — සැකෙවිනි පළ කළ දැනුමට සරු වන**'' **යනාදි** පද්‍යයෙන් ද, ග්‍රන්ථාවසානයෙහි එන ෂඩරචක්‍රබන්ධනාත්මක වූ කර්තෘ නිර්දේශ පද්‍යයෙන් ද ඉඳුරා පැවසේ. එහෙත් මෙ කියන පතිරජ පිරුවන්පති කවරෙක් ද එපිරිවෙන කොහි පිහිටියක් ද යන්න පිළිබඳ ව විද්වතුන් අතරෙහි ඒකමතිකත්වයක් නැත. සමහරුන් මෙහි එන පතිරජ පිරුවන්පති නම් රසවාහිනී, සමන්තකූට වණ්ණනා යන පාලිපොත් ලියූ වේදේහ හිමියන් යැයි ද එතුමන් ලියූ බව කියන සීහළ සද්දලක්ඛණ'නම් මේ සිදත් සඟරාවම යැයි ද පවසන අතර, තවත් අය පවසන්නේ දෛවඥකාමධෙනු, පරොපකාර යන සංස්කෘත ග්‍රන්ථයන්හි කර්තෘ වූ අනවමදර්ශි හිමියන් ම සිදත් කතු පතිරජ පිරුවන්පති වන බවත්, සංග්‍රහාත්මකව කළ සිදතට මුල්ගත් වූ බව සිතිය හැකි සීහළ සද්දලක්ඛණය මෙකල නෂ්ටප්‍රාය කෘතියක් බවත් ය. මෙයින් වැඩියක් ප්‍රබල සාධක ඇත්තේ දෙවැනි මතයට යි.[26] කෝට්ටේ යුගයෙහි විසූ සුමංගල හිමියන් සිදත ලියූ පතිරජ පිරුවන්පති විය හැකි බවට ද මතයක් මහාචාර්ය පරණවිතාන ඉදිරිපත් කොට ඇත.[27] ස්ථානය සම්බන්ධයෙන් ද අත්තනගල්ල, මාදෙල්ගමුව, පළාබත්ගල, කොස්ගොඩ, හොරණ ඈ පෙදෙස්හි පතිරජ පිරුවන පිහිටි බවට මතාන්තර රාශියක් වෙයි.[28] දේව ප්‍රතිරාජ පැරකුම්බා ii රජුගේ ප්‍රධානාමාත්‍ය මෙන් ම ආගමික හා සංස්කෘතික කාර්ය භාර ඇමති ද විය. 'දේව' යනු ඔහුගේ පුද්ගල නාමයත් 'ප්‍රතිරාජ' යනු පදවි නාමයත් බව පැහැදිලි ය. එනිසා මේ යුගයෙහි හා ඉන් පසුවත් ඉතිහාසයෙහි එන ප්‍රතිරාජවරුන් හඳුනා ගැනීම විමසිල්ලෙන් කළයුත්තකි. දේව ප්‍රතිරාජයන් අත්තනගලු වෙහෙර තෙමහල් පහයක් කරවා අනෝමදස්සි තෙරුන්ට පිළිගැන්වූ බව මහාවංශය පවසයි.[29] පාලි 'හත්ථවනගල්ල විහාරවංසය' ලිවීම සඳහා නමන් මෙහෙයවනු ලැබූයේ අනෝමදස්සි තෙරුන් විසින් බව තද්ග්‍රන්ථ කර්තෘ ම

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

සඳහන් කරන හෙයින්[30] එම සම්බන්ධතාව තවදුරටත් ප්‍රකට වෙයි. අනවමදර්ශි හිමියන් 'ප්‍රතිරාජපති මහාවිහාරනේතා' යනුවෙන් 'පරෝපකාර' නම් ස්වකීය කෘතියෙහි දී තමන් හඳුන්වා ගනියි. මේ අනුව, ප්‍රතිරාජ මහාවිහාරයත් ප්‍රතිරාජ පිරිවෙනත් එක ම ආයතනයක් නම් අනවමදර්ශි හිමි නිසැකව ම දඹදෙණි යුගයෙහි විසූ පතිරජ පිරුවන්පතිවරයෙකි. සිදත ලියූ පතිරජ පිරුවන්පති පසුව එතැනට පත් අන් අයකු වීමට බැරි නැතත් දෛවඥකාමධේනුවේත් සිදතේත් එන ඇතැම් සමාන යෙදුම් දෙපොත ම එක් අයකුගේ බවට ඉඟි කරයි.

3.1.9 තොටගමුවේ විජයබා පිරිවෙන ද මේ කාලයේ සක්‍රියව පැවති වැදගත් අධ්‍යාපන ආයතනයක් විය. මහාවංශයට අනුව මෙය කරවන ලද්දේ මහා විජයබාහු රජකු විසිනි[31] මේ පොළොන්නරුවේ රජ කළ විජයබාහු i (1055 1110) රජු බව නිසැක ය. ජිනචරිත නම් පාලි කාව්‍යයේ කතුවරයා වූ මේධංකර තෙරුන් ද විජයබාහු රජු විසින් තම නමින් කරවූ පිරිවෙනක විසූවකු බව එහි නිගමන ගාථාවලින් පැවසේ. මේ ද ඉහත කී තොටගමුවේ විජයබා පිරිවෙන ම විය හැකියි. මෙකියන මේධංකර තෙරුන් දඹදෙණි ශාසන ශුද්ධියෙහි මුල් තැන ගත් ආරඤ්ඤක මේධංකර තෙරුන් ම ද යනු සැක සහිත වුවද දඹදෙණි — කුරුණෑගල යුගයේ දී විසූවකු බවට සාධක ඇත. කුරුණෑගල පැරකුම්බා iv (1302 — 26) රජු කුරුණෑගල් සිය නමින් පිරිවෙනක් කරවා මේධංකර නම් තෙර නමකට දෙවූ බවත්[32] මහ විජයබා රජු කරවූ තොටගමුවේ විජයබා පිරිවෙන්හි නවකම් කරවා ගම්වර ද සමග කායසත්ථි නම් තෙරුන්ට සමර්පණය කළ බවත්[33] මහා වංශය පවසයි. මේ කායසත්ථි තෙරුන්ට පෙර විජයබා පිරිවෙන්පතිව සිටියේත් ඉන් පසු තත්කාලීන රාජධානිය වූ කුරුණෑගල පිහිටි පැරකුම්බා පිරිවෙන්හි ආධිපත්‍යයට පත්වූයේත් ජිනචරිත කර්තෘ වූ මේධංකර තෙරුන් ම විය හැකි ය. ''සකුමගද හෙළකව්නළු කිවිසත ගත් උගත් ඇදුරු තෙරිඳු පැරකුම්බා පිරිවෙන'' යනුවෙන් දෙව්රද දම්පසඟිනාවන් දළද සිරිතේ නිගමන වාක්‍යයෙහිලා දක්වන්නේත්, පැරකුම්බා iv රජු විසින් ජාතක පොත රැක ගැනීමේ කාර්යය පැවරීම සඳහා තෝරා ගන්නේත්[34] මෙතුමන් ම බව පෙනේ. කාව්‍යශේඛරාදි ග්‍රන්ථයන් කළ වියත් සිළුමිණි ශ්‍රී රාහුල වාගීශ්වර සංඝරාජයන්ගේ සීයා බව කියන උතුරුමූළ රාහුල මහ තෙරුන් විසූයේ ද තොටගමුවේ විජයබා පිරිවෙන්හි ය. එතුමා එහි ආධිපත්‍යයට පැමිණෙන්නට ඇත්තේ කායසත්ථි තෙරුන්ගෙන් පසුව ය.. ගිරා සන්දේශාදියෙහි උත්කර්ෂයෙන් කර ඇති වර්ණනා අනුව ශ්‍රී රාහුල සංඝ-රාජයන්ගේ ආධිපත්‍යය යටතේ විශ්වවිද්‍යාලය ස්වරූපයේ අධ්‍යාපනයක් දෙන ජාත්‍යන්තර ප්‍රසිද්ධියෙන් යුත් අධ්‍යාපන ආයතනයක් බවට පත්වූයේ මේ විජයබා පිරිවෙන යි. ජිනචරිතකාර මේධංකර තෙරුන් හෝ කායසත්ථි තෙරුන් හෝ උතුරුමූළ අධිපතිව සිටි බවට සාධක ලැබී නැතත් විජයබා පිරිවෙන දිගුකලක පටන් උතුරුමූළ හා සම්බන්ධ අධ්‍යාපන ආයතනයක් වූ බව පෙනේ.

3.1.10 දඹදෙණි යුගයෙහි ප්‍රසිද්ධ වූ තවත් අධ්‍යාපන ආයතනයක් නම් මයුරපාද පිරිවෙන යි. මේ ප්‍රසිද්ධියට ප්‍රධාන හේතුව නම් ධර්මග්‍රන්ථයක් වශයෙන් මෙන්ම ගද්‍ය කාව්‍යයක් වශයෙන් ද සිංහල පාඨකයන් අතරෙහි ප්‍රකට පූජාවලියේ කතුවරයා දඹදෙණි යුගයේ දී මයූරපාද පරිවේණාධිපතිව සිටි බුද්ධපුත්‍ර තෙරුන් වීම යි. පූජාවලි කතුවරයා ඉතිහාසඥයකු ද වූ බව එහි තෙතිස් වන සූතිස් වන පරිච්ඡේදවලින් හෙළි වන අතර දඹදෙණි යුගයේ ඉතිහාසය හැදෑරීමේ දී පූජාවලිය වෙසෙසින් වැදගත් වේ. පූජාවලිය ලියා ඇත්තේ පැරකුම්බා ii රජුගේ අවසාන කාලයේ හෝ තදාසන්න කාල

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පරිච්ඡෙදයේ දී ය. දැනට අවිනෂ්ටව ඇති පැරණිතම සිංහල වෛද්‍යක ග්‍රන්ථ වන යෝගාර්ණවයත් ප්‍රයෝග රත්නාවලියත් මෙතුමන්ගේ ම කෘතිහු ය. පැරකුම්බා ii රජු පුත් බුවනෙකබා i (1272-84) රජුගේ කාලයේ දී ඒවා ලියා ඇති අතර, එයින් යෝගාර්ණවය ලියා ඇත්තේ කතුවරයා වාකිරිගල වසද්දී ය.[35] ප්‍රයෝග රත්නාවලි යෙහි මයුරපාද නමින් පමණක් කතුවරයා හැඳින්වෙන හෙයින් එය මයුරපාද පිරිවෙන්හි දී ම ලියූ සේ සලකනු ලැබේ. පූජාවලියේ 4 වන පරිච්ඡෙදයෙහි ලා කතුවරයා ම කියන පරිදි එය ලියා ඇත්තේ දේව ප්‍රතිරාජයන් විසින් කරවන ලද ආරාමයක දී ය.[36] මෙය ප්‍රතිරාජ පිරිවෙන යටතේ ඉහත කී ආරාම අතුරෙන් එකක් හෝ අනෙකක් හෝ විය හැකි ය. ප්‍රස්තුත දේව ප්‍රතිරාජ ආරාමය පළාබත්ගල බවට කිරිඇල්ලේ ඤාණවිමල හිමි කරුණු දක්වා තිබේ.[37] එහෙත්, මයුරපාද පිරිවෙන පිහිටා තිබුණේ අනුරාධපුරයේ බව සාමාන්‍ය පිළිගැනීම වේ. පූජාවලියට අනුව බුද්ධදාස (337 — 365) රජු කර වූ මොනරපා පිරිවෙන ම පසු කලෙක දී අධ්‍යාපන ආයතනයක් වී යැයි ද දඹදෙණි යුගයේ දී පූජාවලී කතුවරයා ආධිපත්‍යය දැරූ මයුරපාද පිරිවෙන එය ම යැයි ද සිතිය හැකි ය. පූජාවලියෙහි ''මෙසේ මේ මොනරපා පිරිවෙන ආදි වූ බොහෝ සංඝාරාම කරවා'' යන පාඨයෙහි ''මේ'' යන විශේෂණය යෙදීමද එයට සාක්ෂ්‍යයකි.[38] කතුවරයා එකල 'පිරිවෙන' මුඛ්‍ය වශයෙන් සංඝාරාමයක් වූ සේ සැලකූ බවක් ද එයින් ගම්‍ය වේ. මහාවංශයෙහි 'මෝර පරිවේණ' නමින් දැක්වෙන්නේ[39] මෙය යි. පසු කාලයේ විසූ ධාතුසේන, මහානාග, දයෝපතිස්ස ආදි රජුන් කීප දෙනෙකු ම මෙහි නවකම් ආදිය කරවූ බව ද මහා වංශය පවසයි.[40] මේ අනුව මොනරපා පිරිවෙන අනුරාධපුර යුගයේ සිට බොහෝ දුරට අඛණ්ඩව දිගු කලක් භික්ෂුවාසව පැවති ආරාමයක් වූ බව පෙනේ. මොනරපා පිරිවෙන වාකිරිගල පිහිටි සේ සලකන්නෝ ද වෙති.[41] කෙසේ වුවත් මෙය දඹදෙණි යුගයේ දී අධ්‍යාපන ආයතනයක් වශයෙන් මහනෙත්පා මූලට අනුබද්ධ වූ 'නැඟී' පිරිවෙනක්ව පැවති බව සිතිය හැකි ය.

3.1.11 දඹදෙණි යුගයේ දි අනුරාධපුරයෙහි පැවති තවත් පිරිවෙනක් නම් පැරකුම්බා ii රජුගේ සොහොයුරු බුවනෙකබා මාපාණන් විසින් කරවන ලද බව පෙනෙන බුවනෙකබා පිරිවෙන යි. මෙයට ඇති එකම සාධකය නම් ඔහු විසින් එතැන්හි පිහිටුවා තිබූ සෙල්ලිපියකි.[42]

3.1.12 සේනානාථ පිරිවෙන ද දඹදෙණි යුගයේ අනුරාධපුරයෙහි පැවති පිරිවෙනකි. පැරකුම්බා ii රජු පුත් විජයබාහු යුවරජු රුවන්වැලි සෑයෙහි නවකම් ඇරඹූවේ සේනානාථ පිරුවන් පති මහතෙරුන් ප්‍රමුඛ සංඝයාට දන්වැට පිදීමෙන් අනතුරුව යි.[43] මෙය පූජාවලියෙහි එන්නේ ''සෙනෙවිරත් පිරිවෙන් ආදි මහාසංඝයාට''[44] යනුවෙනි. කල්‍යාණවතී රැජිනගේ (1202—09) බතලගොඩ වැවේ පුවරු ලිපියෙන් පෙනෙන්නේ සෙනෙවිරත් පිරිවෙන මුලින් කරවූයේ ලක්විජයසිඟු සෙනෙවිනාවන් විසින් බවත් ඇය එය පිළිසකර කරවූ බවත් ය. (රඹා වැව හා ඉරිපින්නියාව ටැම් ලිපිවල එන කුට්ඨා සෙනෙවිරදුන් කර වූ සෙනෙවිරද් පිරිවෙන අනෙකක් විය යුතු ය.) මහා වංශයෙහි ''සේනාපතිරාජ නාමං — පරිවේණං අකාරයී''[45] යනුවෙන් දැක්වෙන අක්බෝ iii (626—41) රජු කල පොත්ථසාත ඇමතියා කළ පිරිවෙන 'සේනාපතිරාජ' නම් වීයයි ගතහොත් එය සෙනෙවිරත් පිරිවෙනේ ප්‍රථමාරම්භය සේ ද ගත යුතු වෙයි. පසු කල්හි 'සෙනෙවිරත් මුළ' බවට පත්වූයේ මෙකී සෙනෙවිරද් පිරිවෙන විය හැකිය. සෙනෙවිරද් මුළ මිහිඳු iv (956—72) රජුගේ සෙල්ලිපියක ද සඳහන් වන්නකි.[46] එය ජේතවනාරාමයට අනුබද්ධ වූ ආයතනයක් විය. දඹදෙණි යුගයේ අනුරාධපුරයෙහි

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

වූ සේනානාථ පිරිවෙන සෙනෙවිරද්මූලට අනුබද්ධ වූ ආයතනයක් විය හැකිය. ඉහත කී වුත්තමාලා සන්දේසයෙහි මහානාගකුල විහාරයෙහි විසූ සේනාපති මූල තෙරනමක් වර්ණිත ය. සෙනෙවිරද් මුළ 14 වන සියවස තෙක් ද පැවති බව ඉන් පෙනේ.

3.1.13 ‘පස් පිරිවෙන’ (පංච පරිවේණ) යන නාමාන්තරයෙන් ද හැඳින්වෙන ‘පස්මුළ පිරිවෙන’ (පංචමූල පරිවේණ) දඹදෙණි යුගයෙහි ප්‍රසිද්ධව පැවති තවත් පිරිවෙනකි. මේ යුගයේ විසූ පංචමූල පරිවේණාධිපති මහ තෙරුන් විසින් ‘භෙසජ්ජ මංජුසා’ නම් වෛද්‍ය ග්‍රන්ථයත් ‘සික්ඛාපද වලංජන’ නම් විනය සංග්‍රහ ග්‍රන්ථයත් පාලි භාෂාවෙන් ලියා ඇත. මෙකියන ගත්කතුවරයාගේ පුද්ගල නාමය ‘අත්ථ දස්සී’ වූ බවට අනුමාන කර ඇතත්[47] එයට පදනම් කර ගත් සාධක දුබල වේ. පස් මුළ පිරිවෙන පිහිටා තිබෙන්නට ඇත්තේ දැදිගම හෝ තදාසන්න ප්‍රදේශයක ය. පොළොන්නරු යුගයේ දී දැදිගම විසූ කිත්සිරිමේ යුවරජු, පැරකුම්බා කුමරුන් කැඳවා ගෙන ඊමට පෙරමඟට යැවූ දූත පිරිසට පංච මූල පරිවේණාධිපති අභය තෙරුන් ද ඇතුළත් වූ බව මහා වංශය කියන හෙයිනි[48] මේ පිරිවෙන පැරකුම්බා i රජු නිකායත්‍රය සමගි කොට එක් නිකායක් කිරීමට පෙරාතුව අභයගිරි මහා විහාරය හා අනුබද්ධව පැවති මූලායතන පසේ සහභාගිත්වයෙන් පොළොන්නරු යුගයේ මුල් අවදියේ දී ප්‍රාරබ්ධව පැවති අධ්‍යාපන ආයතනයක් වන්නට ඇත. කල්‍යාණි ශිලා ලිපියෙහි සඳහන් මංගල තෙරුන් විසූ පංචපරිවේණය මේ පංච මූල පරිවේණය ම නම් මෙම ආයතනය 15 වන සියවසේ අවසානය තෙක් ම පැවති බව කිව හැකි ය.

3.1.14 සිඳුරුවාණේ වල්ගම්පායෙහි අභයරාජ පිරිවෙන දඹදෙණි යුගයෙහි පැවති තවත් අධ්‍යාපන ආයතනයකි. මෙය විජයබාහු iv රජු විසින් වල්ගම්පාය විහාරයෙහි කරවන ලද්දක් බව මහාවංශයෙහි මෙන් ම පූජාවලියෙහි ද සඳහන් වෙයි.[49] රාජ රත්නාකර නම් සිංහල ඓතිහාසික ග්‍රන්ථය ලියා ඇත්තේ පසු කලෙක, — එනම්, 1542 දී සෙංකඩගල් නුවර රජ පැමිණි වීරවික්‍රම රජු කල — අභය රාජ පරිවේණාධිපතිව වැඩ විසූ වල්ගම්පායේ තෙරුන් විසිනි.

3.1.15 අභිධර්මාර්ථ සංග්‍රහයට හා අභිධර්මාවතාරයට ටීකා ග්‍රන්ථ ලියූ සුමංගල තෙරුන් විසූ නන්දි පිරිවෙන ද[50] මේ යුගයේ පැවති අධ්‍යාපන ආයතනයකි. සුමංගල මහ තෙරුන් පොළොන්නරුවේ ජේතවනාරාමාධිවාසී වූ ශාරීපුත්‍ර සංඝරාජයන්ගේ ශිෂ්‍යයකු වුව ද, සංඝරක්ෂිත මාහිමියන් මෙන් ම දඹදෙණි යුගය තෙක් ජීවත් වූ බව පෙනේ. විජයබා යුවරජු පොළොන්නරු රාජධානියත් එයට අයත් නෂ්ටප්‍රාය විහාරාරාම පිරිවෙන් ආදියත් පෙර වූ පරිදි පිළිසකර කරවා ජනගහනද කරවූ බව ඉතිහාසගත ය.[51] මෙය ද එසේ පුනරුත්ථාපිත වූ පිරිවෙනක් විය හැකිය. විනය විනිච්ඡය ටීකාව ලිවීම සඳහා වාචිස්සර මහ තෙරුන්ට ආරාධනා කළවුන්ගෙන් කෙනෙකු වූයේ ද ‘සුමංගලප්පසාදිනී’ නමැති ඛුද්දක සික්ඛා ටීකාව ලිවීම සඳහා සංඝරක්ෂිත මාහිමියන්ට ආරාධනා කළේ ද අරඤ්ඤවාසී වූ සුමංගල තෙර නමකි. කලින් හෝ පසුව හෝ නන්දි පිරිවෙන්හි විසුවේත් එතුමා ම ද යන්න නොපැහැදිලි ය. පූජාවලි කතුවර මයුරපාද හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ සහෝදරාචාර්ය වූ බව කියන වාකිරිගල විසූ මහනෙත්පා මූල සුමංගල මහතෙරත්, සුමංගලප්පසාදිනිය ලිවීමට ආරාධනා කළ සුමංගල තෙරත්, නන්දි පිරිවෙන් වැසි සුමංගල තෙරත් එක් අයෙක් ද නැතහොත් දෙදෙනෙක් ද තිදෙනෙක් ද යනු විචාර්ය කරුණකි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

3.1.16 පාලි ථූපවංසයේ නිගමන ගාථාවන්හි දැක්වෙන පරිදි එය ලියනු සඳහා වාචිස්සර තෙරුන්ට ආරාධනා කළ පිටකත්‍රය පාරගතයකු වූ 'පත්තචීවරපාදයන්' විසූ 'මහින්දසේන පිරිවෙන' මේ යුගයෙහි පැවති බව සිතිය හැකිය. ථූපවංසය මෙන්ම පාලි ටීකා ග්‍රන්ථ කීපයක් ද විසුද්ධිමග්ග සංඛෙපයට සිංහල සන්නයක් ද ලියූ වාචිස්සර තෙර ශාරීපුත්‍ර සංඝරාජයන්ගේ ශිෂ්‍ය නමකි. පොළොන්නරුවේ පැර කුම්බා i රජුගේ පුස්තකාලයාධිකාරී ද වූ එතුමන් දඹදෙණි යුගය තෙක් ජීවත් වූවත් නැතත් පත්තචීවරපාදයන් විසූ මහින්දසේන පිරිවෙන එතෙක් පවතින්නට බැරිකමක් නැත. මේ කියන මහින්දසේන පිරිවෙනත් ඉහත කී මහින්ද බාහු පිරිවෙනත් ආයතන දෙකක් විය යුතුය. 'මහින්දසේන' පිරිවෙන සේන ii (853—87) රජු දින, ඔහු සොහොයුරු වූ මහින්ද යුවරජු විසින් දෙදෙනා නමින් කරවන ලද්දකි.[52]

3.1.17 අලුත්නුවර 'අස්සද්දනා පිරිවෙන' (ශෂ්‍යවර්ධන පරිවෙණ ?) ද දඹදෙණි යුගයේ වූ පිරිවෙනක් බව 'අලුත්නුවර දේවාල ලිපියෙන්[53] පෙනේ. එය ද පැරකුම්බා ii රජු විසින් දේව ප්‍රතිරාජයන් ලවා කරවන ලද්දකි. පසුව බුවනෙකබා i රජු දින මෙය තවදුරටත් දියුණු කොට, 'උත්පලවර්ණ දේවරාජ පිරිවෙන' යන අභිනව නාමයද දී අස්සද්දනා පිරිවෙන් තෙරුන් ගේ ඥති ශිෂ්‍ය වූ සුමංගල තෙරුන්ට එහි පිරිවෙන්පති පදවිය පවරන ලදී.[54]

3.2.0 සැකෙවින් ඉහත සඳහන් කළ පරිදි අනුරාධපුර යුගයේ අවසාන භාගයෙහි පටන් ම ලක්දිව අධ්‍යාපන ඉතිහාසයෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කළ බව පෙනෙන මූලායතන., දඹදෙණි යුගයේ දී ද ශාසනික — අධ්‍යාපනික වශයෙන් ප්‍රමුඛ ස්ථානයක් ඉසිලූ බව දඹදෙණි කතිකාවතින් හෙළි වන අතර වෙනත් ඓතිහාසික වාර්තාවලින් තහවුරු ද වේ. එක් එක් මූලක ආරම්භය අනුරාධපුර යුගයේ දී රටේ විවිධ ස්ථානවල වෙන් වෙන් වශයෙන් සිදුවුවත්, වඩා උසස් හා විධිමත් වූ සේවාවක් ලබා ගැනීමේ හා සම්බන්ධීකරණයේ පහසුව සඳහා මේවා කීපයක් එක්තැන් කිරීමේ ප්‍රයත්න ද වරින් වර ඇති වූ බව පෙනේ. 10 වන සියවසේ දි විශ්ව විද්‍යාලය ස්වරූපයෙන් දියුණුව පැවති අභයගිරි මහාවිහාරයට මහනෙත්පා මූළ, උතුරු මූළ, වහදු මූළ, කපාරා මූළ යන ආයතන සතර අන්තර්ගතව පැවති අතර, ඒ එක එකක් සඳහා විශාල ප්‍රදේශයක් පුරා පැතිරී සිටි අවශ්‍ය පහසුකම් සහිත ගොඩ නැගිලි වූ බවට ශිලාලේඛන ඇතුළු පුරාවිද්‍යාත්මක සාධක ලැබී තිබේ. පොළොන්නරු යුගයේ 'පංච මූළ පරිවේණ'ය ද මෙබඳු තවත් ප්‍රයත්නයක ප්‍රතිඵලයක් විය හැකි බව ඉහත දැක්විණ. පැරකුම්බා i රජු පොළොන්නරුවෙහි කරවූ ජේතවනාරාම මහාවිහාරයට මහාර්ඝ වූ මහා ප්‍රාසාද යක් හා තවත් ත්‍රිභූමක ප්‍රාසාද අටක් ද අන්තර්ගත වූ අතර, එයින් මහාප්‍රාසාදය ශාරීපුත්‍ර මාහිමියන්ට ද අනෙක් ප්‍රාසාද අට වටනාපස සමග අෂ්ටායතනවාසීන්ට ද පිරිනමන ලදී.[55] මාඝාදීන් කළ ශාසන හානිය නිසා අඩපණව පැවති මූලායතනවලට නව පණක් දීම සඳහා පැරකුම්බා ii රජු දැරූ ප්‍රයත්නය දඹදෙණි කතිකාවතේ එන අෂ්ටායතන පදවි පත්කිරීම පිළිබඳ ව්‍යවස්ථා මාලාවෙන් හෙළිවේ.[56]

3.2.1 දඹදෙණි යුගයේ දී අෂ්ටායතනයම පුනර්ජීවනයට පත් කළ නමුදු ඉන් කීපයක් සෙස්සට වඩා සක්‍රියව පැවති බව පෙනේ. එසේ බෙහෙවින් සක්‍රියව පැවති එක් ආයතනයක් නම් මහානෙත්තප්පසාද නොහොත් මහානෙත්තපාද මූළය යි. 'මහ නෙත්පා මූළ' යනු එහි හෙළ වදන යි. වාකිරිගල මහානෙත්තපාද මූළයේ මූලස් ථානය බවට පත්වූයේ දඹදෙණි යුගයේ දී ය. වාකිරිගල හෙවත් වානගිරි පර්වතය සොළීන් හා යුද වැදුණු මහාවිජය බාහු i රජුගේ ආරක්ෂා ස්ථානයක් විය. දඹදෙණි

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පැරකුම්බා කාලයේ දී විජයබා යුවරජු වාකිරිගල මාලිගාවක් සහිත බලකොටුවක් තනවා, පසුව ගලමුදුනෙහි මහා විහාරයක් කොට එය මහනෙත්පා මූළ තෙරුන්ට පිළිගැන්වීය. මෙකියන මහනෙත්පා මූළ තෙර නම් පූජාවලී කතුවරයාගේ ජ්‍යෙෂ්ඨ සහෝදරාචාර්ය වූ සුමංගල මහතෙරණුවෝ යි.[57] මෙතුමන් පිළිබඳව ඉහත සඳහන් කෙරිණ.

අක්බෝ iv (658—74) රජු කරවා ධර්මරුචික භික්ෂූන්ට පිදූ බව කියන 'මහා නෙත්තපාද පරිච්ඡේද' පරිවේණ ය. මහනෙත්පා මූළට පසුබිම් වූ සේ සැලකේ.[58] පසු කාලයෙහි ශ්‍රී නිවාස පරිවෙණාධිපති රඹුංගොඩ දීපංකර, ශ්‍රී සනානන්ද පරිවේණාධිපති වීදගම මෛත්‍රෙය ආදී මහතෙරහු ද මහනෙත්පා මූළ පදවිය දැරූහ. කුරුණෑගල පැරකුම්බා iv රජු දින ඇරඹුණු වීදගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන[59] කෝට්ටේ යුගයේ දී මහත් ප්‍රසිද්ධියක් ඉසිලීය. එය මුල පටන් ම මහනෙත්පා මූළට අනුබද්ධ ආයතනයක් වූ බව පෙනේ. ගතාරා උපතපස්වීන් ලියූ 'වුත්තමාලා' නම් පාලි සංදේශ කාව්‍යයෙහි මූළායතන හතරක අධිපති තෙරුන් වර්ණිත වන අතර එයින් එක් ආයතනයක් වන්නේ මහනෙත්පා මූළ යි[60] මෙකියන 'ගතාරා උපතපස්සි' නම් ඇදිගම සමීපයෙහි වූ සේ සැලකෙන ගතාරා පිරිවෙන්හි උප ප්‍රධානව සිටි තෙරනම ය. ගතාරා පිරිවෙන සම්බන්ධව පැවැත්තේ විල්ගම්මූළට බව කැලණි විහාර සෙල්ලිපියෙන් පෙනේ. ('ගතාරා පිරිවෙන්' යන්න 'ගතාරා පරිවෙණ' යනුවෙන් පාලියට නගා ඇත. එහෙත් 'ගතාරා' යන්න 'ග්‍රන්ථාකර' යන්නෙන් බිඳී එන 'ගතාර' (ගත්–ආර) යන්නේ රූපාන්තරයක් වන්නට ද පිළිවන. අනුරාධපුරයෙහි ද ග්‍රන්ථාකර පිරිවෙනක් විය.[61] එය කාශ්‍යප iv රජු විසින් කරවන ලද්දකි.)

3.2.2 'විල්ගම් මූළ' ද දඹදෙණි යුගයෙහි හා ඉන් පසුවත් සක්‍රියව පැවති ආයතනයකි. 'විල්ගම් මූළ' යන්න පාලියට නගා ඇත්තේ 'සරෝගාම / සරසිගාම මූළ' යනුවෙනි. මහාවංශයෙහි 'සරෝගාම තිත්ථ' යනුවෙන් මහවැලි ගඟේ තොටුපළක් හැඳින්වේ. ත්‍රිකුණාමල ප්‍රදේශයෙහි පෙරියකුලම් වැවට නුදුරෙහි පිහිටි මෙකල 'වෙල්ගම් වෙහෙර' නමින් හැඳින්වෙන විහාර ස්ථානය විල්ගම් මූළට පසුබිම් වූ සේ සැලකේ. භාතිය රජුගේ (143—67) සෙල්ලිපියක 'වෙල්ගම අබගර විහර' යනුවෙන් මෙය හඳුන්වා ඇත.[62] සත්කෝරළේ ද පුරාණ විහාරයක් සහිත විල්ගමක් වෙයි. අභිධානප්පදීපිකාව කළ මොග්ගල්ලාන තෙරණුවෝ විල්ගම් මූළ ආධිපත්‍යය දරමින් පැරකුම්බා i රජු එම මූළ උදෙසා ජේතවන මහාවිහාරයෙහි කර වූ ප්‍රාසාදයෙහි විසූහ. බෙම්තොට ගලපාත විහාරයත් පොළොන්නරු — දඹදෙණි යුගයේ එහි පැවති 'ධර්මරාජන් පිරිවෙනත්' විල්ගම් මූළට අනුබද්ධ වූ බව ගලපාත විහාර ශිලාලේඛනයෙන්[63] පෙනේ. සිංහල අනාගත වංශය ලියූ විල්ගම් මූළ හිමිතුමා දඹදෙණි යුගයේ විසූවෙකැයි සැලකේ. සිංහල බෝධිවංශයත් සූර්ය ශතක සන්නයත් ලියූ විල්ගම්මූළ හිමි කුරුණෑගල යුගයෙහි විසූවෙකි. සූර්ය ශතක සන්නයේ අවසන එතුමාගේ නම ශ්‍රී පරාක්‍රමබාහු විල්ගම්මූළ යැයි ද එතුමා ගලතුරුමූළ මාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍ය යැයි ද දක්වේ. එතුමා සිංහල බෝධි වංශය ලියුයේ කිත්සිරිමෙවන් කැලණි විහාරයේ අධිපතිව වෙසෙද්දී ය. මේ කාලයේ දී එතුමන් එහි සෙල්ලිපියක් ද පිහිටුවා ඇත. අනාගත වංශය ද මෙතුමා ගේ කෘතියකැයි සමහරු කියති. 'සඳකිඳුරුදා කව' දෙනගමු වෙහෙර වැසි, විල්ගම්මූළ තෙර නමකගේ කෘතියකි. ඉහත කී[64] වුත්තමාලා සංදේශයෙහි ද විල්ගම්මූළ තෙර නමක් වර්ණිතය.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

3.2.3 උතුරොළ මූල - (=පාලි: උත්තරෝළ්හ මූල) නොහොත් උතුරු මූල (=පාලි: උත්තර මූල) මෙකල බෙහෙවින් සක්‍රියව පැවති තවත් ආයතනයකි. මහාවංශාගත පුරාවෘත්තයකට අනුව මෙයට මුල් වූ බව පෙනෙන 'උතුරොළ පිරිවෙන, මානවම්ම (මහලැපාණ) (676—711) රජු විසින් අභයගිරි විහාරයෙහි මහණ වූ සිය දෙටු සොහොයුරා සඳහා තනවා වටනාපස හා මෙහෙකරුවන් ද සහිතව පුදන ලද භික්ෂූන් 600 කට නේවාසික පහසුකම් සැපයූ විශාල ආයතනයක් විය.[65] පූජාවලියෙන්[66] හා දළදා සිරිතෙන්[67] මෙපුවත තවදුරටත් තහවුරු වේ. සේන i (831—51) රජු ද, සේන ii (851—85) රජු ද උතුරොළ පිරිවෙන සංවර්ධනය කර ඇත.[68] මිහිඳු iv (956—72) රජුගේ අභයගිරි ලිපියෙහි සඳහන් වන අභයගිරි මහාවිහාරාන්තර්ගත සතර මූලින් එකක් වූ උතුරු මූල පැන නැගුණේ යටකී උතුරළ පිරිවෙනෙන් බව නිසැක ය. දළදාව ලක්දිවට වැඩමවා ගෙන ආ තැන් පටන් ම ඒ පිළිබඳ පුද පූජා ප්‍රදර්ශන ආදිය පැවැත්වීම, අභයගිරි විහාරයට පැවරී තිබුණු බව 'ෆාහියන්' භික්ෂු නමගේ දේශාටන වාර්තාවෙන් හෙළිවෙයි. එම වගකීම ඉහත කී මානවම්ම රජු දින පටන් උතුරළ පිරිවෙන (පසුව —මූළ) වෙත පැවරිණ.[69] පොළොන්නරුවේ විජයබාහු i (1054—1114) රජු දින දළදා භාරකාරත්වය ඉසුලුවේ ද උතුරළ මූළ වෛයාකරණික මුගලන් මහතෙරුන් බව පොළොන්නරුවේ වේළෛක්කාර දෙමළ සෙල් ලිපියෙන් පැවසේ. මෙකියන උතුරළ මූළ මුගලන් මහතෙර නම් මොග්ගල්ලාන පාලි ව්‍යාකරණයේ කතුවරයා යි. අනුරුද්ධ ශතක නම් සංස්කෘත පද්‍ය ග්‍රන්ථය ලියූ අනුරුද්ධ තෙර උතුරළ මූළ අනුතෙර පදවිය දැරුවෙකි. දඹදෙණි යුගයේ දී උතුරළ මූළ පදවිය දැරුවෝ කවුරුද යන්න නොපැහැදිලි ය. එහෙත් කෝට්ටේ යුගයෙහි තොටගමුවේ විජයබා පිරුවන් පත්ව සිටි ශ්‍රී රාහුල වාගීශ්වර සංඝරාජයන් උතුරළ මූළ රාහුල මහතෙරුන් ගේ මුනුබුරු වූ බවත් ශ්‍රී ශාරිපුත්‍රාදිමහාස්වාමි පරම්පරාවට අයත් වූ බවත් එතුමා ලියූ බුද්ධිප්පසාදිනි නම් පදසාධන ටීකාවේ නිගමනයෙහි එයි.

3.2.4 දඹදෙණි යුගයේ සක්‍රියව පැවති ආයතනයක් වූ ගලතුරු මූළ ගැන, දෙවිනුවර නන්දන පිරිවෙන පිළිබඳව ඉහත කළ විස්තරයෙහි ලා සඳහන් කෙරිණ. ගලතුර මූළ පාලියෙහි හැඳින්වෙන්නේ සේලන්තර මූළ, උපලන්තර මූළ, සේලන්තරායතන ආදි නම්වලිනි.. පැරකුම්බා i (1153—86) රජු දින පොළොන්නරුවේ පැවති ශාසන ශුද්ධියට රුහුණේ සංඝයා පැමිණියේ ගලතුරු මූළ නන්ද තෙරුන් ප්‍රමුඛ කොට ගෙන ය.[70] දඨෝපතිස්ස ii (659—67) රජුගේ මුනුබුරකු වූ ද මහණ ව ධුතගුණ පුරමින් රුහුණෙහි ගල් අතරෙක (=සේලන්තරයෙක) විසූවාවූ ද තෙර නමක් රජු විසින් ග්‍රාම වාසයට කැඳවා ගෙන අවුත් උන්වහන්සේ ප්‍රධාන භික්ෂු සමූහයා වැස් වූ ආයතනය සේලන්තර සමූහ (=ගලතුරු මූළ) නම් වූ බවත් අපේක්ෂකයා කලින් දින රාත්‍රියෙහි (උපුල්වන්?) දෙවොලෙහි වස්වා දේවානුමතියෙන් ගලතුරු මූළ ආයතන පදවිය පත් කිරීමේ සිරිත එතැන් පටන් පැවත ආ බවත් මහා වංශය කියයි.[71] දඹදෙණි යුගයේ දී විජයසුන්දරාරාමයෙහි වැඩ වෙසෙමින් ශාසනික – ආධ්‍යාපනික සේවාවෙහි යෙදුණු සංඝරක්ෂිත මාහිමියන් වහන්සේ ශාරිපුත්‍ර සංඝරාජයන්ගෙන් ධර්මශාස්ත්‍ර උගත් ශිෂ්‍යයකු වුවත් පැඹිද්දෙන් ගලතුරු මූළ සීල නම් තෙරුන්ගේ ශිෂ්‍ය වූ බව වුත්තෝදය නිගමනයෙන් පෙනේ. විල්ගම්මූළ තෙරුන්ගේ ආචාර්ය වරයා වශයෙන් සූර්ය ශතක සන්නයේ අවසානයෙහි දැක්වෙන රාජගුරු ගලතුරු මූළ මහතෙරුන් දඹදෙණි යුගයෙහි විසූ බව සිතිය හැකිය. රම්මුංගොඩ දීපංකර තෙරුන්ගේ ආචාර්යවරයා වශයෙන් වෘත්තමාලාඛ්‍යාවෙහි දැක්වෙන මහතෙරුන් ශෛලාන්තර මූලාධිපති පදවියට පත්වූයේ ඉන් අනතුරුව විය යුතුය. මූලායතන පදවිය ශිෂ්‍යානු

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ශිෂ්‍ය පරම්පරාවෙන් උරුම වන්නක් නොව චාරිත්‍ර නියමානුකූලව පත්කරනු ලැබුවක් බව අවසන දැක්වූ කිදසුන් දෙකෙන් ස්ඵුට වේ. උපලන්තර මූල (ගලතුරු මූල) තෙර නමක් ගතාරා උෂපිරිවෙන් තෙරුන්ගේ වෘත්තමාලාවෙහි ද වර්ණිත ය.[72]

3.2.5 සෙනෙවිරද් මූල ද මේ කාලයේ තරමක් දුරට හෝ සක්‍රියව පැවති බව පෙනේ. 14 සියවසේ රචිත වෘත්තමාලාව සේනාපති මූල තෙරුන් වර්ණනා කරන හෙයිනි. මෙහි ප්‍රභවය පිළිබඳව ඉහත[73] සේනානාථ පිරිවෙන යටතේ විස්තර කෙරිණ.

3.2.6 අෂ්ටායතනයන් අතුරෙන් ඉහත විස්තර කළ ආයතන පස හැරුණු විට, කපාරා මූළ, වහදු මූළ, දකුණු ගිරි මූළ යන ආයතනවල දඹදෙණි යුගයෙහි හා ඉන් පසු පැවැත්ම පිළිබඳ තොරතුරු ඇත්තේ මඳකි. මේ ආයතන අතුරෙන් පළමු දෙක කෙළින්ම අභයගිරි විහාරාන්තර්ගත වූ අතර, අනෙක ද එයට අනුබද්ධ ආයතනයක්ව පැවතිණ. පොළොන්නරුවේ සිදු කළ නිකාය සාමග්‍රියෙන් පසු අභයගිරි නිකායක් තවදුරටත් නොපැවති අතර අෂ්ටායතන ක්‍රියා කළේ ස්වාධින භික්ෂු සමූහ වශයෙනි. අපරෝක්ත ආයතනත්‍රයට ලැබුණු අනුග්‍රහයන් අඩුවීම නිසා ඒවායේ භික්ෂු සංඛ්‍යාව ද ක්‍රමයෙන් අඩුවන්නට ඇත. දඹදෙණි යුගයේ දී මෙකී ආයතන ත්‍රයෙහි වැදගත්කම ආයතන පදවි පත්කිරීමට පමණක් සීමා වන්නට ඇතැයි සිතිය හැකිය.

3.4.3 දඹදෙණි කතිකාවතින් උදුරා ඉහත දැක්වූ පාඨයට මා කළ අර්ථකථනය අනුව. පිරිවෙන් අතුරෙන් ඉහළ ම සැලකිල්ල දිනා ගත් පිරිවෙන් වර්ගය වූයේ 'මාතෙරුන් පිරිවෙන්' ය. කතිකාවතේ ව්‍යවස්ථා මගින් ම ග්‍රාම වාසයට එකක් හා වනවාසයට එකක් දැයි උභය වාසය සඳහා මාතෙර පදවි සංඛ්‍යාව දෙකකට සීමා වූ බැවින් ඒ යුගයේ 'මා තෙරුන් පිරිවෙන්' සංඛ්‍යාව ද දෙකකට සීමා විය. මෙයින් ග්‍රාමවාසයෙහි 'මා තෙරුන් පිරිවෙන' වූයේ දඹදෙණියේ විජයසුන්දරාරාම මහාවිහාරය යි. දඹදෙණි යුගය ආරම්භයේ දී දිඹුලාගල ආරණ්‍ය සේනාසනය වනවාසයෙහි 'මා තෙරුන් පිරිවෙන' සේ සැලකුණු අතර, පළාබත්ගල ආරණ්‍ය සේනාසනය දියුණු වූ පසු එයට එම තත්වය ලැබුණු බව පෙනේ.

3.4.1 මෙතෙක් දඹදෙණි යුගයේ පිරිවෙන් පිළිබඳව කළ විස්තරයෙහි ලා ඒ යුගයේ කිසියම් නිශ්චිත ආයතනයකට සම්බන්ධ වී අධ්‍යාපනයේ යෙදී සිටි පැවිදි පඬිවරුන් සමහර දෙනෙකුගේ නම් ද සඳහන් කරන ලදී. එබඳු අධ්‍යාපන ආයතනයකට බැඳී සිටි බවට සෘජු සාධක ලැබී නැතත් මේ යුගයේ අධ්‍යාපන කටයුතුවල නියැලී සිටින්නට ඇතැයි සිතිය හැකි තවත් ගිහි පැවිදි පඬිවරුන් හා ලේඛකයන් කීප දෙනෙකුද මෙහිදී අපේ සැලකිල්ලට යොමු විය යුතු ය. නිකාය සංග්‍රහයේ ග්‍රන්ථකාරක නාමාවලියෙහි එන (සද්ධර්ම රත්නාවලි කාර) ධර්මසේන හිමි, (පාලි සාරසංගහ කාර) ශ්ලෝක සිද්ධාර්ථ හිමි, (අඥාත ග්‍රන්ථ කාර) දීපංකර හිමි, (පාලි උපාසක ජනාලංකාරය ලියූ) ආනන්ද හිමි, (පද සාධන කාර) පියදස්සි හිමි, එකී නාමාවලියෙහි නොඑන පද සාධන සන්නකාර (දෙවන) ආනන්ද වනරතන හිමි, (සම්බන්ධ චින්තා සන්න කාර) ගෝතම හිමි, (සමහර විට) (සිංහල ධාතුවංශ කාර) කකුසන්ධ හිමි ආදීහුත් එබඳු පැවිදි පඬුවෝ වෙති. සිහළ සද්ද ලක්ඛණ, සමන්තකූට වණ්ණනා, රසවාහිනී යන පොත් ලියූ වේදේහ හිමියනුත්, රූප සිද්ධි ආදිය ලියූ දීපංකර බුද්ධප්පිය හිමියනුත් සමහරුන් දඹදෙණි යුගයෙහි ලා ගණිතත්, ඔවුන් පොළොන්නරු යුගයෙහි විසූ බවට ප්‍රබල සාධක ඇති බව කිව යුතුය. කාලානුක්‍රමය සම්බන්ධයෙන් නිකාය සංග්‍රහ නාමලේඛනයේ ආනුපූර්විකතාව එතරම් විශ්වසනීය සාධකයක් නොවේ.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

3.4.2 නිකාය සංග්‍රහ නාමලේඛනයෙහි එන ගිහි පඬිවරුන් අතුරෙන් තිදෙනෙකු පමණක් දඹදෙණි යුගයට අයත් වන බව පෙනේ. එනම්, (බුත්සරණ ආදිය ලියූ) ආගම (විද්‍යා?) චක්‍රවර්ති, (සිංහල ස්තූප වංශය ලියූ) පරාක්‍රම පණ්ඩිත, (අඥාත ග්‍රන්ථ කාර) අග්‍ර පණ්ඩිත යන මොවුහු ය. විශුද්ධි මාර්ග මහා සන්නය ආදි ග්‍රන්ථ ලියූ පරාක්‍රමබාහු ii රජතුමා ද මේ යුගයට අයත් ශ්‍රේෂ්ඨ පඬිවරයෙකි. තමාට සාජුව ම අධ්‍යාපන කාර්යයෙහි යෙදීමට ඉඩක් නොලැබුණත් එතුමා රටපුරා අධ්‍යාපනය දියුණු කිරීමට මහත් වෙහෙසක් දැරිය. රජුගේ සොහොයුරු බුවනෙකබා මාපාණන් ත්‍රිපිටක ධරයකු වූ බව පමණක් නොව භික්ෂූන්ට ත්‍රිපිටකය ඉගැන්වීමෙහි නියුතු වූ බව ද ඉතිහාසගතව ඇත. සාමාන්‍යයෙන් පිරිවෙන්වල ගුරුවරු භික්ෂූහු වූහ. බමුණු පඬිවරුන් කීප දෙනෙකු හැරුණු විට, ගිහි පඬිවරුන් පිරිවෙන්වලට බැඳී ඉගැන්වීම කළ බවට සාධක නැත. ඔවුන් සිය ගෙදර ම 'ගුරුගෙදරක්' වශයෙන් යොද ගනිමින් එසේ කරන්නට ඇතැයි සිතිය හැකිය. පිරිවෙන් ශිෂ්‍යයෝ ද වැඩි වශයෙන් භික්ෂූහු හා භික්ෂුත්ව අපේක්ෂකයෝ වූහ. ගිහි පිරිමින්ට ද පිරිවෙන් අධ්‍යාපනය ලැබිය හැකිවිය. ලාභාපේක්ෂාවෙන් තොරව ඔවුන්ට ඉගැන්විය යුතු බවට කතිකාවත් නියමයක් අවශ්‍ය වූයේ එහෙයිනි.[74] ඉගෙනීමක් අපේක්ෂා කළ කාන්තා පක්ෂය එය ලබා ගත්තේ ගුරුගෙදරින් හෝ ගෙදරට ගෙන්වා ගන්නා ගුරුවරුන් මගිනි.

4.1 මෙහි දී අපේ අවධානය යොමු විය යුතු තවත් වැදගත් කරුණක් නම් දඹදෙණි යුගයේ පිරිවෙන් අධ්‍යාපන විෂය මාලාව යි. අනුරාධපුර යුගයෙහි සිට ම ලක්දිව මූලික අධ්‍යාපනයට අක්ෂරය (කියවීම), ලිඛිතය, ගණිතය යන විෂයත්‍රය ඇතුළත් විය. මේ යුගයෙහි ද එය එසේ ම වූ බව පූජාවලියෙන් හා සද්ධර්ම රත්නාවලියෙන් හෙළිවේ. මූලික අධ්‍යාපනය ගුරුගෙදරින් හෝ ගමේ පන්සලෙන් ලැබිය හැකි වූ අතර, ද්විතියක හා උසස් අධ්‍යාපනයක් ලැබිය හැකි වූයේ පිරිවෙන් ආයතන ආදියෙනි. සාමාන්‍යයෙන් පිරිවෙන්වල උගන්වනු ලැබූවේ ත්‍රිපිටක ධර්මය ප්‍රධාන කොට ඇති 'ශාස්ත්‍ර' විෂයෝ යි. ශිල්ප විෂය හා ලලිතකලා විෂය උගත හැකි වූයේ ඒ ඒ විෂයයන් පිළිබඳ ප්‍රවීණ ආචාර්යවරුන්ගෙන් හෝ ශිල්පායතනවලිනි. වෛද්‍ය ශාස්ත්‍රය හා ජ්‍යොතිශ්ශාස්ත්‍රයන් පිරිවෙන්වල ඉගැන්වුව ද එය ග්‍රන්ථ ඥානයට සීමා වූ හෙයින් ප්‍රායෝගික දැනුම ලබා ගත යුතු වූයේ වෛද්‍යවරුන් දෛවඥයන් ළඟ වැඩ කිරීමෙනි. ඇතැම් ශිල්ප පාරම්පරික විය. කලාතුරෙකින් ඇතැම් ශිල්පයක හෝ ලලිත කලාවක ප්‍රවීණ වූ භික්ෂූන් සිටිය ද ඒවා පිරිවෙන් විෂය මාලාවට ඇතුළත් වූ බවක් නොපෙනේ.

4.3 මහාවංශය හා පූජාවලිය කියන පරිදි විජයබා iii රජු භික්ෂු සාමණේරවරුන්ට ත්‍රිපිටකය ඉගෙනීමේ පහසුකම් සැලැස්වූ අතර[75] ගම ගම කුලියට පොත්පත් ද ලියවීය[76]. පරාක්‍රමබාහු ii රජ දඹදිවින් පොත්පත් ගෙන්වා ආගමයන්හි ද සියලු තර්ක ව්‍යාකරණයන්හි ද භික්ෂූන් හික්මවීය.[77] විජයබාහු iii රජ සිය දරුවන් දෙදෙනා සකල කලා ශිල්පයන්හි[78] ධර්මනීති ලෝකනීති රාජනීති අක්ෂර ලිඛිතාදි නොයෙක් කලා ශිල්පයෙහි නිපුණ කරවිය.[79] පරාක්‍රමබාහු i කුමරුට ඉගැන් වූ ශිල්ප ශාස්ත්‍ර අතර බුද්ධාගම කෞටිල්‍යාදි නීති ශාස්ත්‍රය, ශබ්ද ශාස්ත්‍රය, නිඝණ්ඩු, කේටුභ, කාව්‍ය ශාස්ත්‍රය නාට්‍ය, ගීත, හස්ති ශිල්පාදිය හා දුනු කඩු ශිල්පාදිය විය.[80]

4.4 විජයබා iii රජු පැරකුම්බා ii කුමරුන් ශික්ෂණය කරවූ විෂය පිළිබඳ වඩා පූර්ණ විස්තරයක් දඹදෙණි අස්නෙහි එයි. එම විෂය මාලාවට ග්‍රන්ථ දෙමළ, සිංහල, නිඝණ්ඩු, කසයින් ව්‍යාකරණ, මුගලන් ව්‍යාකරණ, මාගධ, සංස්කෘත, නිඝ බණ, තෙර බණ, විනය පිටක, සූත්‍ර පිටක, අභිධර්ම පිටක, අංගුත්තර සඟිය, සුළු සඟිය,

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ - www.oriental.lk

වැදුම් සහිය, ධාතු පාඨ, ඡන්දෝ ලක්ෂණ, ත්‍රිවේද, නක්ෂත්‍ර, ශික්ෂා, මෝක්ෂ, සිරිත, කඩු සරඹ, පළඟ සරඹ, නෙත්තම්, රාජවිල්, දොළොස් භාෂා, ධනුශ්ශිල්ප, සාමුද්‍රිකා, පරකථා, නීති ශාස්ත්‍ර, තර්ක ආදි අෂ්ටාදශ ශිල්ප, ඉතිහාස, පුරාණ, අග්නිස්තම්භ, ජලස්තම්භ, උච්චාටන, සූප ශාස්ත්‍ර, ත්‍රෝටන, දූර ගමන, දූර දර්ශන, හෙරිත්‍රෝටන, පත්‍රච්ඡේද, චිත්‍ර කර්ම, දූතය, භරතය, ස්ත්‍රී ලක්ෂණ, පුරුෂ ලක්ෂණ, නපුංසක ලක්ෂණ, පරහිත ඥාන, කනක පරීක්ෂා, ස්තේනක පරීක්ෂා, ආකර්ෂණ, ආකාශ ගමන, කාෂ්ඨ කර්ම, හේම කර්ම, රත්න පරීක්ෂා ආදි සූසැට කලා ශිල්ප ද ඇතුළත් වේ. පොත අවසන්හි පසුකලෙක එකතු කළ බව පෙනෙන[81] වැකියක් නිසා ඇතැම් සාහිත්‍ය ඉතිහාසකාරයන් මෙය කුරුණෑගල යුගයේ කෘතියක් ලෙස සැලකුවද දඹදෙණි පැරකුම්බාවන් ජීවත්ව සිටියදීම ලියූ කෘතියකැයි නිගමනයට සාධක ඇත.

4.2 සූසැටක් කලා ශිල්පවල කෙළ පැමිණි බව කීම පෞරාණික ශිෂ්ට සමාජයෙහි ශාස්ත්‍රීය වෘත්තීය හා සෞන්දර්යාත්මක අධ්‍යයන්ගේ පරිසමාප්ත භාවයට කෙනෙකු පත් වූ බව ඇඟවීමේ භාරතීය සම්ප්‍රදය විය. එබැවින් එම ලයිස්තුවේ එන තත්කාලීන ලාංකික සමාජයට වැදගත් නුවූ ඇතැම් විෂය නොසලකා හරින්නට ඇතැයි සිතීම සාධාරණ ය. දඹදෙණි අස්න පවා ලයිස්තුවේ සමහර විෂය ගෙන ඇත්තේ ආදි ශබ්ද යෙනි. පුනරුක්ත හෝ අතිව්‍යාපී බව පෙනෙන විෂය නාම කීපයක් ද ඇත. ඒ සමග ම වෙන වෙන නම්වලින් වුවද මෙකල උසස් අධ්‍යාපන ආයතනවල ඉගැන්වෙන සෑම විෂය ප්‍රදේශයක් ම පාහේ ඊට ඇතුළත් වන අතර, උගතුන් මිථ්‍යා විශ්වාස හැටියට සලකතත් සාමාන්‍ය මිනිසාට වැදගත් වන අභිචාර කර්ම ගණයේ විෂය කීපයකුත්, සංග්‍රාම හා ක්‍රීඩා කුශලතා ගණයේ විෂය කීපයකුත් එහි අන්තර්ගත ය. අභයගිරි විහාරය මුල පටන් ම වාගේ අභිචාරකර්ම ඇතුළත් තාන්ත්‍රික ඉගැන්වීම්වලට ද අනුබල දී ඇත. පොළොන්නරු කාලයේ කළ නිකාය සාමග්‍රියෙහි එක් ප්‍රතිඵලයක් වූයේ අභයගිරිකයන් හා සාමාන්‍ය ජනයාගෙන් පමණක් රැකුල් ලැබුණු එබඳු ඉගැන්වීට හා පිළිවෙත් විදි ලාංකික සමාජයේ පොදු පිළිගැන්මට බඳුන්වීම යි. දඹදෙණි කතිකාවතින් ''යකුන් කෙළවීම් බලිතිබීම්. බලිබත් කියවීම් ආදිය'' මහණුන්ට තහනම් කිරීමට සිදු වූයේ එකල ඇතැම් මහණුන් එබඳු ක්‍රියාවල යෙදුණු හෙයිනි. සංග්‍රාම හා ක්‍රීඩා කුශලතා ලැබිය හැකි වූයේ පිරිවෙනෙන් බැහැරිනි. එහෙයින් ධනුර් විද්‍යාව බැහැර කළ විට 'දසටක් ශිල්ප (විද්‍යා) අනුරෙන් සෙස්ස පිරිවෙන් අධ්‍යාපන විෂය මාලාවට ඇතුළත් වීමේ බාධාවක් නොතිබුණි. විජයබා පිරුවන්පතිට ද ''දසට විදුනැන් පවෙණි'' වූ බව ගිරා සන්දේශය කියයි.[82] කෝට්ටේ යුගයේ විජයබා පිරුවන්හි හා පද්මවතී පිරුවන්හි ඉගැන්වූ පාඨමාලාවන්ට අභිධර්ම, සූත්‍ර, විනය, චතුර්වේදය, ජෝතිර් විද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය, ඡන්දෝලංකාර ව්‍යාකරණ, තර්ක න්‍යාය, කව් නළු සතර යන විෂය ඇතුළත් වූ අතර. පිරුවෙන්පතිතුමා අෂ්ට මහා ව්‍යාකරණය, ෂඩ්දර්ශනය, ඡන්දෝලංකාර හා අෂ්ටාදශ පුරාණ ද හදළ දසට විදුනන්හි කෙළ පැමිණියෙක් විය.[83] දඹදෙණි යුගයේ වුව ද උසස් තත්වයේ පිරිවෙනක හා පිරිවෙන් යතිවරයකුගේ ස්වරූපය වටහා ගැනීමට ඉහත කී විස්තරය අපට උපකාරි වෙයි.

4.5 භාෂාන්තර ඥානය ද මුල පටන් ම පිරිවෙන් අධ්‍යාපනයේ අවියෝජනීය අංගයක් විය. ධර්මදූත සේවා සඳහා මෙන් ම රාජ්‍ය දූත හා වර සේවා සඳහා ද භාෂාන්තර ඥානය අවශ්‍ය විය. ත්‍රිපිටකය හා භාරතීය දර්ශනාන්තර වටහා ගැනීම සඳහා අනිවාර්යයෙන් අවශ්‍ය වූ හෙයින් පාලි සංස්කෘත භාෂා ඇතුළු ප්‍රාචීන භාෂාවන්ට

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

**විහාරිය** අධ්‍යාපනයෙහි ප්‍රමුඛස්ථානයක් ලැබී **තිබුණේ** අනුරාධපුර මුල් අවදිෙ
පටන් ම ය. දඹදෙණි යුගයේ ද එම තත්වය නොවෙනස්ව පැවතුණි. දඹදෙණි අස්න
අනුව උගතකුට අඩු වශයෙන් සිංහල, **ග්‍රන්ථ දෙමළ**, පාලි, සංස්කෘත යන භාෂා දැනු
අවශ්‍ය විය. යථොක්ත විෂය **මාලාවෙහි එන** දොළොස් භාෂා යන්නෙන් අභිප්‍රේ
වූයේ ඉහත කී භාෂාවලින් අන්‍යතර වූ **චීන**, ජාවක, යවන (ග්‍රීක,) පංජාබි, පාර
අරාබි, තෙලිඟු, **කර්ණාට**, වැනි දේශාන්තර භාෂා දොළහක් **විය** යුතුය. පසුකලෙ
උපාධි නාමයක් **බවට පත්** '**ෂඩ්** භාෂා පරමේශ්වර' යකු **වීම සඳහා** මාගධි, අර්ධ මාගධි
මහාරාෂ්ට්‍රී, ශෞරසේනී, පෛශාචී, අපභ්‍රංශ **යන** ප්‍රාකෘත විශේෂද උගත යුතු විය.

5. සාමාන්‍යයෙන් බලන විට, දඹදෙණි යුගයේ පඬිවරුන් දළවශයෙන් කොටස
දෙකකට බෙදිය හැකි ය. මේ යුගයේ පළමු පරපුරට සංසංක්ෂිත, සුමංගල යන
**මාහිමිවරුන් වැනි** පොළොන්නරු යුගයෙහි විසූ **දිඹුලාගල** මහා කාශ්‍යප, ටීකාචාර්ය
**ශාරිපුත්‍ර**, වෛයාකර්ණික මෞද්ගල්‍යායන යන මාහිමිවරුන්ගේ සම්ප්‍රදයෙන් අ
අප්‍රතිම පාණ්ඩිත්‍යය රැක ගත් මහ පඬිවරු අයත් වෙති. දෙවන පරපුරට අයත්
සාර සංග්‍රහ, පූජාවලී, සද්ධර්ම රත්නාවලී කතුවරුන් වැනි අය උසස් පඬිවරුන් වුව
ඔවුන්ගේ බහුශ්‍රැත භාවය සීමාසහිත විය. දඹදෙණි යුගයේ පළමු පරපුරේ පඬිවරුන්ගේ
බහුශ්‍රැත භාවය වටහා ගැනීම සඳහා ඉහත කී නාමලේඛනවලට වඩා වහල් වන්නේ
ඔවුන් රචනා කළ ග්‍රන්ථ ය. විශුද්ධිමාර්ග මහා සන්නය, රූපසිද්ධි සන්නය, සසදවත්
සන්නය වැනි පොත්වල එන සමර්ථන පාඨ හා මතාන්තර විචාරයන් ද සම්බන්ධ
චින්තා, සුබෝධාලංකාරාදියෙහි අන්තර්ගතයන් ද විමසා බැලීමෙන් මේ බව මනාව
ස්ඵුට වෙයි. මෙකී දෙවන පරපුරේ පඬිවරුන්ගේ අභාවයත් සමග ඇරඹ අනුක්‍රමයෙන්
අඩුවෙමින් ගිය ඈදුරු පරපුරේ පාණ්ඩිත්‍යය හා පිරිවෙන් අධ්‍යාපනයේ දීප්තිය රැක
ගැනීම සඳහා කුරුණෑගල යුගයේ දී ප්‍රයත්නයක් දරන ලදි. කුරුණෑගල යුගයෙන්
පසු තවදුරටත් පිරිහෙමින් ගිය පිරිවෙන් අධ්‍යාපනය **පුනර්ජීවයක්** ලැබ ජාත්‍යන්තර
කීර්තියට නැවත පාත්‍රවූයේ ජයවර්ධනපුර කෝට්ටේ **යුගයෙහි** දී ය.

**සඳහන සටහන්:**

1. **පිරිවෙන්, පිරුවන්,** පරිවේණ ශබ්දයන්හි නිරුක්ති හා ඓතිහාසික අර්ථ පරිණාමය පිළිබඳව **වෙනත්** ලිපියක විස්තර වන නිසා මෙහි සාකච්ඡා නො කෙරෙන බව යැලකුව මනා ය.
2. භූද මහාවිහාර යන්න යෙදෙන තන්හි ඉන් ලක්දිව පළමුව පිහිටුවූ මහාවිහාරය වන අනුරාධපුර තිස්සාරාම මහාවිහාරය අභිප්‍රේතයි.
3. කතිකාවත් සඟරා, ඩී. බී. ජයතිලක සං,. 1955, 13 පිට.
4. ඉහත 1.2.2 හා පහත එන 2.3 ද බලන්න.
5. කතිකාවත් සඟරාව, 11 පිට.
6. මහා වංශ (සිංහල) 81. 51–52, පූජාවලිය සූතිස් වන පරිච්ඡේදය. මාබෝපිටියේ මේධංකර සං. 19፥5, 36–38 පිටු, නිකාය සංග්‍රහ, වේරගොඩ අමරමෞලි සං., 1955, 26 පිට.
7. ම.ව. 81. 53–56, පූජා. 27 පිට.
8. පූජා. 34, 27 පිට.
9. ම. ව. 81.59.
10. හංස සන්දේශ, ධර්මවර්ධන සං. 183 පද්‍යය.
11. ඩී. බී. ජයතිලක, සිංහල සාහිත්‍ය ලිපි, 1940, 31–51 පිටු.
12. පී. බුද්ධදත්ත, පාලි සාහිත්‍යය, 1957, පිටු 54 පටන්.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

13. ම. ව. 84. 27–28.
14. ම. ව. 84. 49–51.
15. මැද උයන්ගොඩ විමලකිත්ති. ශිලාලේඛන සංග්‍රහය, 5 කාණ්ඩය. 283 පිට.
16. වාල්ප් ගොඩකුඹුරේ. ශාස්ත්‍රීය ලිපි හා කථා, 1971, ''අලුත්නුවර දේවාලය කරවීම'', 106 පිට.
17. ම. ව. 78. 10.
18. ම. ව. 84. 22–24, පූජා 31, 33 පිට.
19. පී. බුද්ධදත්ත, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ 1948, 114 පිටේ සිට, එම පාලි සාහිත්‍යය, 438 පිටේ සිට.
20. සද්ධර්ම රත්නාකරය, දේවානන්ද සං., 1955, 532–33 පිටු.
21. ම. ව. 85. 1–59, පූජා. 34, 34–36 පිටු.
22. ම. ව. 85. 60–62. පූජා. 34, 36 පිටු
23. ම. ව., 85. 63–64, පූජා. 34, 36 පිට
24. ම. ව., 88. 53–60, පූජා. 34,. 46 පිට
25. ම. ව. 90. 85–87
26. මුනිදාස කුමාරණතුංග, සිදත් සඟරා විවරණය, 1936, ප්‍රස්තාවනාව, ආනන්ද කුලසූරිය, සිංහල සාහිත්‍යය 2, 1963, 230 – 34 පිටු.
27. විමල් ජී. බලගල්ලේ ''සිංහල සාහිත්‍ය ඉතිහාසය හා අන්තරාලීන ශිලා ලිපි'' සංස්කෘති, 1983, 17 දක. 16 පිට.
28. පී. බී. සන්නස්ගල, සිංහල සාහිත්‍ය වංශය, 1964, 168 පිටෙහි සිට. එම ''පූජාවලිය''. සාහිත්‍යය, දඹදෙණි කලාපය 1958, 45–46 පිටු. මැද උයන්ගොඩ විමලකිත්ති. ''දඹදෙණියුගයේ පඬිවරුන් හා පිරිවෙන්''. එම 35 පිටෙහි සිට. කිරිඇල්ලේ ඤාණවිමල. සපරගමු දර්ශන, 1967, 73–78 පිටු, ගොඩකුඹුරේ. ''සිදත් සඟරාව'' ශාස්ත්‍රීය ලිපි. 145 පිට.
29. ම. ව. 87. 34–48.
30. හත්ථවනගල්ල විහාර වංස. ප්‍රාරම්භක ගාථා 3.
31. ම. ව. 90. 88
32. ම. ව. 90. 86
33. ම. ව. 90. 88–92.
34. ම. ව. 90. 80–84.
35. යෝගාර්ණවය. කේ. ඤාණවිමල ස.. 1963. 2 පිට.
36. පූජාවලි. ධර්මානන්ද ස.. 1951. 41 පිට.
37. සපරගමු දර්ශන 73–78 පිටු. යෝගාර්ණව. ඤාණවිමල ය'.. ප්‍රස්තාවනා.
38. පූජා – 34., 17 පිට.
39. ම. ව. 37. 172–3.
40. ම. ව. 38. 52. 40. 100. 43..28.
41. M. B. Ariyapala, Society.
42. ශි. ස..4 කා.. පිටු 185 සිට.
43. ම. ව.. 88. 86.
44. පූජා. 34. 47 පිට
45. ම. ව. බුද්දදත්ත ස.. 44.23
46. ශි. ස.. 4 කා.. 140 පිට.
47. G. P. Malalasekera.
48. ''පව පරිවේණ මූලායි වාසිභය යතිස්සර'' ම. ව.. බු. ස.. 65. 61.
49. ම. ව.. 86.52: පූජා. 34: 45 පිට.
50. අභිධම්මත්ථ විකාසනි නාම අභිධම්මාවතාරටීකා, නිගමන ගාථා 4 5 ගාථා..
51. ම. ව. 88. 90–120: පූජා. 34: 46–48.
52. ම. ව. 51. 59–61.
53. වාල්ප් ගොඩකුඹුරේ. ශාස්ත්‍රීය ලිපි. පිටු. 101–09.
54. එහිම 106 පිට.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

55. ම. ව. 78. 32–34. පූජා. 34: 23 පිට.
56. කතිකා. 13 පිට.
57. ම. ව. 88.43–47: පූජා. 34: 45 පිට.
58. ම. ව. 48.2.
59. ම. ව. 90. 98–99.
60. 44 පද්‍යය.
61. ම. ව. 52. 57.
62. C. A. Nicholas
63. ශ්‍රී. ස.. 5 කා. 144–47 පිටු.
64. 45 පද්‍යය.
65. ම. ව. 57. 3. 27.
66. පූජා 34: 20 පිට.
67. සෝරත සං.. 42 පිට.
68. ම. ව. 50. 77: 51.76.
69. ම. ව. 57. 24.
70. ශ්‍රී 3. 1. 3 බ.
71. 57. 33–40.
72. 43 පද්‍යය.
73. 1. 12.
74. කතිකා. 19 පිට.
75. ම. ව. 81. 53.
76. පූජා 34. 27 පිට.
77. ම. ව. 84. 27.
78. ම. ව. 81. 76.
79. පූජා. 34. 28 පිට.
80. ම. ව. 64. 3–5.
81. C. E. Godakumbura, Sinhalese Literature. 1955, pp.110–111
82. 242 පද්‍යය.
83. ගිරා 219–27 හා 242–42: හංස 170–79.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk